CSR
CENTRE FOR SOCIETY & RELIGION
EA INFO

පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් මාස 50ක් ඉක්බිති...

# පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධ ප්‍රධාන නඩු 11ක් පිළිබඳ විශේෂ කරුණු

(2021 ජනවාරි 01 - 2023 ජූනි 21)

සමාජ හා සාමයික කේන්ද්‍රය
පර්යේෂණ කණ්ඩායම

## **<u>කාරක සාරාංශය</u>**

පුද්ගලයන් 287 දෙනෙකුට පමණ ජීවිත අහිමි කරමින්, පුද්ගලයන් 600 දෙනෙකුට පමණ තුවාල සිදුකරමින් සිදු වූ 2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ පාස්කු ඉරුදින ප්‍රහාරය අවිවාදයෙන්ම සැලකිය හැක්කේ යුද සමයෙන් පසුව ශ්‍රී ලංකාවේ සිදු වූ විශාලතම මිනිස් සංහාරය ලෙස යි. ක්‍රිස්තියානි දේවස්ථාන තුනක්, ප්‍රධාන පෙළේ හෝටල් තුනක්, තානායමක් සහ එක් නිවසකට ඉන් දරුණු විනාශයක් ඉන් සිදු විය. වින්දිතයන්ගේ පවුල් සහ එකී සිද්ධි මාලාවෙන් දිවි ගලවාගත් අය බොහෝ දෙනෙක් අඛණ්ඩව එහි දුර්විපාක අත්දකිමින්, යුක්තිය පතා කටයුතු කරමින් සිටිති.  අවම වශයෙන් විදේශිකයන් 40 දෙනෙක්වත් සහ ළමයින් 45 දෙනෙක් මෙකී සිද්ධි මාලාව නිසා ජීවිතක්ෂයට පත් වූ බව වාර්තා විය. සම්බන්ධිත  බෝම්බ ප්‍රහාර මාලාවේ ප්‍රධාන සැකකරු ලෙස ජාතික තව්හීද් ජමාත් සංවිධානයේ නායක සහ්රාන් හෂීම් නමැත්තාව පරීක්ෂණ පවත්වන පුද්ගලයන් විසින් හඳුනාගන්නා ලදී. ඉහත කී සිද්ධීන් පිළිබඳව වාර්තා කිරීමට අමතරව, පාස්කු ප්‍රහාරය සිදු වී මාස 50ක් ගතවීම අනුස්මරණය කිරීම සඳහා, පාස්කු ප්‍රහාරය හා සම්බන්ධව අධිකරණයේ විභාග වන  ප්‍රධාන නඩු කටයුතු පිළිබඳ වැදගත් කරුණු අඩංගු වාර්තාවක් සම්පාදනය කිරීම සඳහා සමාජය සහ සාමයික කේන්ද්‍රය විසින් කටයුතු  යොදා තිබේ. පාස්කු ප්‍රහාරය පිළිබඳව හා ඊට සම්බන්ධ නඩු 11ක් පිළිබඳව සමීපව අධ්‍යයනය කරමින් ලබාගත් තොරතුරු මෙම වාර්තාවේ අන්තර්ගත වන අතර, එකී සෑම නඩුවකම ප්‍රගතිය පිළිබඳව සමස්ත සම්පිණ්ඩනයක් මින් සපයා ඇත.

පාස්කු ඉරුදින බෝම්බ පිපිරුම් මාලාවේ මහමොළකරු ලෙස ද හැඳින්වෙන නවුෆර් මවුලවි නම් පුද්ගලයා ඇතුළුව චූදිත පුද්ගලයන් 25 දෙනෙකුට එරෙහිව කොළඹ මහාධිකරණ ශාලා අංක 01 හි පවරා ඇති අංක HC (TAB) 2972/2021 දරන අපරාධ නඩුකරය, පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාර මාලාව සම්බන්ධයෙන් පවරා ඇති නඩු අතර ප්‍රධානතම අපරාධ නඩුකරය ලෙස සැලකේ. මෙම නඩුව විනිසුරුවරුන් තිදෙනෙක් ඉදිරියේ, එනම් විනිශ්චය සමේෂණයක් (Trial-at-Bar) ඉදිරියේ විභාග වන අතර, චෝදනා 23,270කින් සමන්විත අධිචෝදනා පත්‍රය චූදිතයන්ට භාරදීම 2021 ඔක්තෝබර් 04 වැනි දින සිදු විය. මේ වන විට එකී අධිචෝදනා පත්‍රයේ අඩංගු චෝදනා චූදිතයන්ට කියවාදෙමින් පවතී.

කොළඹ මහාධිකරණයේ තවත් විනිශ්චය සමේෂණයක් මගින් පාස්කු ඉරුදින ප්‍රහාරය සම්බන්ධයෙන් සාපරාධී නොසලකාහැරීම පිළිබඳව අංක HC (TAB) 2900/21 දරන නඩුව අරභයා හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දරට අධිචෝදනා පත්‍රය භාරදුන්නේ 2021 ඔක්තෝබර් 01 වැනි දින දී ය. 2022 පෙබරවාරි 18 වැනි දින එකී කොළඹ මහාධිකරණයේ විනිශ්චය සමේෂණය මගින් ඒකමතිකව එළඹුණු නියෝගයක් මගින් ඔහුගේ විත්තිවාචකය නොවිමසාම නිදොස් කොට නිදහස් කරන ලදී. ඊට එරෙහි අභියාචනය මේ වන විට ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී. ඒ හා සමානවම, හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දුට එරෙහිව ද පාස්කු ඉරුදින ප්‍රහාරය සම්බන්ධයෙන් සාපරාධී නොසලකාහැරීම පිළිබඳව අංක HC (TAB) 2899/2021 නඩුව අරභයා කොළඹ මහාධිකරණයේ විනිශ්චය සමේෂණයක් මගින් අධිචෝදනා පත්‍රය භාරදෙන ලද්දේ 2021 ඔක්තෝබර් 01 වැනි දින දී ය. එකී කොළඹ මහාධිකරණයේ විනිශ්චය සමේෂණය මගින් ද ඒකමතිකව එළඹුණු නියෝගයක් මගින් ඔහුගේ විත්තිවාචකය නොවිමසාම නිදොස් කොට නිදහස් කරන ලදී. ඊට එරෙහි අභියාචනය ද මේ වන විට ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී.  2019 වසරේ දී පාස්කු ඉරුදින ප්‍රහාරය නිසා අගතියට පත් පුද්ගලයන් පෙත්සම්කරුවන් වශයෙන් ඉදිරිපත් වෙමින් මූලික අයිතිවාසිකම් පෙත්සම් දොළහක් (අංක 163/19 සමග 165/19, 166/19, 184/19, 188/19, 191/19, 193/19, 195/19, 196/19, 197/19, 198/19, හා 293/19) ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද අතර, එකී පෙත්සම් ශ්‍රේෂ්ඨාධිකරණයේ සම්පූර්ණ විනිසුරු මඬුල්ලක් ඉදිරියේ විභාගයට ගන්නා ලදී. 2023 ජනවාරි 12 වැනි දින, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඉහත අංක සඳහන් සියලු පෙත්සම් අරභයා තීන්දුව ප්‍රකාශ කළ අතර, ඒ අනුව පෙත්සම්කරුවන්ට වන්දි ගෙවන මෙන් වගඋත්තරකරුවන්ට නියෝග කරන ලදී. රජය විසින් එකී තීන්දුවට අනුකූලව ගන්නා ලද ක්‍රියාමාර්ග reparations.gov.lk වෙබ් අඩවිය හරහා විමසා බැලිය හැක.

පාස්කු ඉරිදා ප්‍රහාරයේ එක් බෝම්බකරුවෙකුට සබඳතාවක් තිබුණු ''සේව් ද පර්ල්ස්'' නම් පුණ්‍ය ආයතනය සමග පවත්වන ලදැයි කියන සම්බන්ධතාවක් පිළිබඳව හිජාස් හිස්බුල්ලාට එරෙහිව අංක HC 78/2021 යටතේ නඩුවක් ගොනු කරන ලදී. මෙම නඩුකරය තවමත් පැවැත්වෙන අතර, 2023 ජූලි 14 වැනි දිනට හරස් ප්‍රශ්න සඳහා නියමිතව පැවතිණි. පුත්තලම පිහිටි මද්රසා පාසලක අන්තවාදී දේශනා පවත්වන ලදැයි කියමින් ලුක්මාන් මවුලවි, මොහම්මද් වසීර් මවුලවි, සහ සකීල් ඛාන් මවුලවි යන අයට එරෙහිව ද අංක 188/2021 යටතේ නඩුවක් ගොනු කර ඇත. එකී නඩුව විභාගය සඳහා 2023 ජූලි 10 වැනි දිනට නියම කර තිබුණි. හිටපු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේනට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 23084/22 දරන නඩුව ගොනු කර ඇත්තේ පුද්ගලික පැමිණිල්ලක් වශයෙනි. නිසියාකාරයෙන් අවේක්ෂණ (surveillance) සිදුකිරීමට අපොහොසත් වීම හා/හෝ පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරය හේතුවෙන් සිදු වූ මරණ සහ හානි වළක්වා ගැනීමට අපොහොසත් වීම හා/හෝ සහරාන් හෂීම් සහ ඔහුගේ අනුගාමිකයන් අත්තඩංගුවට ගැනීම සඳහා ත්‍රිවිධ හමුදා හා/හෝ පොලීසියට නියෝග කිරීමට අපොහොසත් වීම මගින් ආරක්ෂක ඇමතිවරයා ලෙස තමන්ට නීත්‍යානුකූලව පැවරී ඇති වගකීම් ඉටුකිරීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් චෝදනා කරමින් මෙම නඩුවේ පැමිණිලිකරු විසින් අදාළ නඩුකරය ගොනු කර ඇත. අංක 23084/22 දරන මෙම නඩුවේ දී ස්වකීය අධිකරණයේ පෙනීසිටින මෙන් කොටුව මහේස්ත්‍රාත්වරයා විසින් හිටපු ජනාධිපතිවරයාට සිතාසි නිකුත් කිරීම නීතිවිරෝධී, ශූන්‍ය, සහ නීතියෙන් බලරහිත බව චෝදනා කරමින් හිටපු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන විසින් අභියාචනාධිකරණයේ CA Writ 354/22 අංක දරන නඩුකරය පවරා ඇත. මෙම නඩුකරය විවාදය සඳහා නියමිතව ඇත. එකී නඩුවේ නියෝගය ලබාදෙන තෙක් ඉහත කී මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 23084/22 දරන නඩුව බහා තබා ඇත. කෑගල්ල මහාධිකරණයේ පවරන ලද අංක 4485/21 දරන නඩුවට අදාළව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අධිචෝදනා 18ක් ගොනු කරන ලදී. සියලුම චූදිතයන් තමන් වැරදිකරුවන් බව පිළිගත් හෙයින්, මෙම නඩුව 2023 ජනවාරි 18 වැනි දින අවසන් කරන ලදී. පුත්තලම මහාධිකරණයේ TAB/107/2021 අංක දරන නඩුකරය ගොනු කර ඇත්තේ පාස්කු ඉරිදා ප්‍රහාර මාලාවට අදාළව වනාතවිල්ලුව ප්‍රදේශයෙන් සො යාගත් පුපුරන ද්‍රව්‍ය සහ පුහුණු කඳවුරක් සම්බන්ධයෙන් අබු හනීෆා මොහම්මදු මුෆීස් *හෙවත්* මුෆීස් *හෙවත්* අබු දහිදා සහ තවත් 5 දෙනෙකුට එරෙහිව විනිශ්චය සමේෂණයක් වශයෙනි. මේ වන විට, චූදිතයන් විසින් ලබා දී ඇති පාපොච්ඡාරණවල විශ්වසනීයත්වය පරීක්ෂා කිරීම සඳහා විමසීමක් සිදුකෙරේ. තවද, HC 148/2021 අංක දරන නඩුව අහ්නාෆ් ජසීම් නම් කවියෙකුට එරෙහිව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ගොනු කර තිබුනේ ඔහුගේ කවිවලින් අන්තවාදී මතවාද පෝෂණය වන බවට චෝදනා නගමින් වන අතර, එම නඩුව තවමත් විභාග වෙමින් පවතියි.

සමාජය සහ සාමයික කේන්ද්‍රය විසින් ඉහත සඳහන් නඩුකර සමීපව අධීක්ෂණය කරන ලද අතර, සමාජය සහ සාමයික කේන්ද්‍රයේ විභාග අධීක්ෂණ වාර්තා අනුසාරයෙන් සහ අධිකරණ කාර්යසටහන් හා වෙනත් සම්බන්ධිත මාධ්‍ය වාර්තා පදනම් කරගනිමින් මෙම සවිස්තරාත්මක වාර්තාව පිළියෙළ කර ඇත. ඊට අමතරව, තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ නීතිපති දෙපාර්තමේන්තුව හා පොලීසිය වෙත ගොනුකරන ලද ඉල්ලුම්පත්‍ර මගින් අප ලබාගත් අදාළ නඩුවල නඩු අංක සහ නඩු පිළිබඳ තොරතුරුවල සම්පූර්ණ ලැයිස්තුවක් ඇමුණුම් වශයෙන් මෙම වාර්තාවට එකතු කර ඇත.

පටුන


**1 වන කොටස: පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරයට වගකිවයුතු බවට චෝදනා කරමින් පුද්ගලයන් 25 දෙනෙකුට එරෙහිව පවරා ඇති අංක HC (TAB) 2972/21 දරන ප්‍රධාන අපරාධ නඩුකරය ........ 4**

**2 වන කොටස: පාස්කු ප්‍රහාරය වළක්වාගැනීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් හිටපු පොලිස්පතිට එරෙහි නඩුව – HC (TAB) 2900/21 ........ 6**

**3 වන කොටස: පාස්කු ප්‍රහාරය වැළැක්වීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් හිටපු ආරක්ෂක ලේකම්වරයාට එරෙහි නඩුව - HC (TAB) 2899/2021........ 8**

**4 වන කොටස: පාස්කු ප්‍රහාරයට අදාළ මූලික අයිතිවාසිකම් නඩු – SC FR 163/2019, SC FR 165/2019, SC FR 166/2019, SCFR 184/2019, SC FR 188/2019, SC FR 191/2019, SC FR 193/2019, SC FR 195/2019, SC FR 196/2019, SC FR No. 197/19, SC FR 198/2019, SCFR 293/2019 ........ 10**

**5 වන කොටස: හෙජාස් හිස්බුල්ලා සහ තවත් අයට එරෙහි නඩුව HC 78/2021 ........ 16**

**6 වන කොටස: මවුලවිවරුන් තිදෙනෙකුට එරෙහි නඩුව - HC 188/2021 ........ 17**

**7 වන කොටස: හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාට එරෙහි පෞද්ගලික පැමිණිල්ල - 23084/22 ........ 17**

**8 වන කොටස: හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් අභියාචනාධිකරණයේ ගොනු කරන ලද රිට් නඩුව - Writ 354/22 ........ 18**

**9 වන කොටස: මාවනැල්ල බුදු පිළිමවලට හානි කිරීමේ සිද්ධියට අදාළ නඩුව - HC 4485/21 ........ 20**

**10 වන කොටස: වනාතවිල්ලුව පුහුණු කඳවුර සහ පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධ නඩුව - පුත්තලම /TAB 107/2021 ........ 21**

**11 වන කොටස: අහ්නෆ් ජෙසීම්ට එරෙහි නඩුව - HC 148/2021 ........ 23**

**ඇමුණුම 1: ........ 32**

**ඇමුණුම 2: ........ 41**

**ඇමුණුම 3: ........ 47**

## 1 වන කොටස: පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරයට වගකිවයුතු බවට චෝදනා කරමින් පුද්ගලයන් 25 දෙනෙකුට එරෙහිව පවරා ඇති අංක HC (TAB) 2972/21 දරන ප්‍රධාන අපරාධ නඩුකරය

නවුෆර් මවුලවි ද ඇතුළුව චූදිතයන් 25 දෙනෙකුට එරෙහිව, පාස්කු ඉරුදින ත්‍රස්තවාදී ප්‍රහාරය ක්‍රියාත්මක කිරීම සඳහා කුමන්ත්‍රණය කිරීම මෙන්ම ඒ සඳහා ආධාර - අනුබල දීම ද[1] ඇතුළත්ව අධිචෝදනා 23,270ක් යටතේ මෙම නඩුකරය පවරන ලද අතර, එය 2022 ජනවාරි 12 වැනි දින කොළඹ විශේෂ ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඩුල්ලක් ඉදිරියේ කැඳවන ලදී.[2] එකී ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ලට මහාධිකරණ විනිසුරුවරුන් වන දමිත් තොටවත්ත, අමල් රණරාජා, සහ නවරත්න මාරසිංහ මහත්වරුන් අයත් වේ. අතිරේක සොලිසිටර් ජෙනරල් හරිප්‍රියා ජයසුන්දර මිය අධිකරණයට සැලකර සිටියේ අදාළ අධිචෝදනා දමිළ හා ඉංග්‍රීසි භාෂාවන්ට පරිවර්තනය කිරීම සඳහා තවදුරටත් කාලය අවශ්‍ය බව යි.[3] දමිළ භාෂාව හොඳින් හසුරුවන නීතිඥයන් නවදෙනෙකු ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් පත්කර තිබුණු අතර, ඉන් පෙර නීතිඥ නියෝජනයක් නොතිබූ චූදිතයන් නියෝජනය කිරීමට ඔබින ආකාරයෙන් එකී නීතිඥයන් පත්කරන ලදී.[4] ඒ අනුව, එකී චූදිතයන් 25 දෙනා සඳහාම දැන් සුදුසු නීතිඥ නියෝජනයක් තිබේ.[5]

22, 23 සහ 24 විත්තිකරුවන් වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා ඇප අයැදුම්පතක් ඉදිරිපත් කළද අනෙක් විත්තිකරුවන්ගේ ඇප ඉල්ලීම් විභාග කිරීමෙන් පසු එකී අයදුම්පත් සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරන බව අතිරේක සොලිසිටර් ජනරාල්වරිය අධිකරණයට දන්වා සිටියාය.[6] ඒ අනුව විත්තිකරුවන්ට ඇප ඉල්ලා ඉදිරි දිනයේදී අයදුම්පත් ඉදිරිපත් කළ හැකි බව විත්තිකරුවන් වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරුන්ට අධිකරණය විසින් දැනුම් දෙන ලදී. [7] අතිරේක සොලිසිටර් ජනරාල්වරිය අධිකරණයට දන්වා සිටියේ මීට පෙර අවස්ථාවක එම නඩු ගොනුවේ පිටපතක් අගතියට පත් පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටින ජනාධිපති නීතිඥවරයෙකු වෙත භාර දී ඇති බවයි. [8]
2022 මාර්තු 03 වැනි දින නඩුව කැඳවූ අවස්ථාවේදී විනිසුරු මඩුල්ල නියෝග කළේ නඩුවට අදාළ සියලු පාර්ශ්වයන් පූර්ව නඩු විභාගය සඳහා කැඳවන ලෙසයි. [9] සැකකරුවන් යළි රිමාන්ඩ් භාරයට පත් කරන ලෙසට ද නියෝග කළ විනිසුරු මඩුල්ල, නඩු විභාගය ආරම්භ කිරීමට පෙර පැවැත්වෙන පූර්ව නඩු විභාගය සඳහා විත්තිකරුවන් ඉදිරිපත් කිරීමට පියවර ගන්නා ලෙස ඔවුන් රඳවා සිටින බන්ධනාගාර බලධාරීන්ට නියම කළේය. [10] අධි චෝදනා පත්‍රවල දෙමළ සහ ඉංග්‍රීසි පරිවර්තන අතිරේක සොලිසිටර් ජනරාල්වරයා විසින් එදින අධිකරණයට ඉදිරිපත් කරන ලදී. [11] නීතිඥවරුන් කිහිප දෙනෙකු විත්තිකරුවන්ට ඇප ලබාදෙන ලෙස අධිකරණයෙන් ඉල්ලා සිටි නමුත් ඇප ලබා ගැනීමට නීතිපතිවරයාගෙන් අවසර ඉල්ලා සිටින ලෙසත් ඊට ඉඩ නොදුන්නේ නම් යළි අධිකරණයට දන්වන ලෙසත් අධිකරණය දන්වා සිටින ලදී. [12] නඩු විභාගය ආරම්භ කිරීමට අවශ්‍ය සියලු අවශ්‍යතා සම්පූර්ණ කර තිබේද යන්න සලකා බැලීම සඳහා නඩුව මැයි මස 12 වැනි දින යළි කැඳවීමට නියම කෙරිණ. [13] 2022 ඔක්තෝබර් මස 03 වැනිදා අතිරේක සොලිසිටර් ජනරාල්වරයා විසින් විත්තිකරුවන්ගේ ඇප ඉල්ලීම්වලට විරෝධය පළ කරමින් ලිඛිත දේශන ඉදිරිපත් කළේය. පරිගණක සාක්ෂි ඇතුළත් ෆ්ලෑෂ් ඩ්‍රයිව් සහ ඩීවීඩී අතිරේක සොලිසිටර් ජනරාල්වරයා විසින් අධිකරණයට සහ විත්ති පාර්ශ්වයට භාර දෙන ලදී. එම උපාංගවල නඩුවට අදාළ දත්ත විශාල ප්‍රමාණයක් අඩංගු බැවින් පරිගණක සාක්ෂි පරීක්ෂා කිරීමට ප්‍රමාණවත් කාලයක් විත්තිකරුවන්ට ලබාදෙන ලෙසද ඇය අධිකරණයෙන් ඉල්ලා සිටියාය. [14] තත්ත්වයන් සැලකිල්ලට ගනිමින්, පරිගණක සාක්ෂි පරීක්ෂා කිරීම සඳහා නඩු විභාගයේ සිට විත්තිකරුට දින 45 ක කාලයක් ලබා දෙන ලදී. විත්තිකරුවන් සියලු දෙනාට ඇප ලබාදෙන ලෙස ඉල්ලා විත්ති පාර්ශ්වය ද ඇප ඉල්ලීම් ඉදිරිපත් කළ අතර එහි නියෝගය මීළඟ නඩු විභාගයේදී ලබාදීමට නියමිතය.[15] 13 වැනි විත්තිකරු වෙනුවෙන් අධිකරණ වෛද්‍ය වාර්තාවක් සහ ඇප ඉල්ලීමක්

අධිකරණයට සහ නීතිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත. 13 වැනි විත්තිකරු සම්බන්ධයෙන් මනෝ වෛද්‍ය වාර්තාවක් කැඳවීමට විශේෂඥ මනෝ වෛද්‍යවරයකු වෙත ඉදිරිපත් කර තිබේ. නඩුව 2022 නොවැම්බර් 24 වැනි දින ප.ව. වැඩිදුර පූර්ව නඩු විභාගයක් සහ ඇප නියෝගයක් සඳහා කැඳවීමට නියමිතය. [16]

2022 නොවැම්බර් 24 වන දින, මෙම නඩුව පූර්ව නඩු විභාගය සඳහා නියම කරන ලදී. යෝජිත පිළිගැනීම් සහිත වීඩියෝ තැටියක් පැමිණිල්ල විසින් සියලුම විත්තියේ නීතිඥවරුන්ට ලබා දී තිබුණි. [17] ඇතැම් කරුණු පිළිගැනෙන අතර අනෙක් කරුණු මතභේදයට තුඩු දෙන බව නීතිඥවරු අධිකරණයට දන්වා සිටියහ. අතිරේක සොලිසිටර් ජනරාල්වරයා අධිකරණයට දන්වා සිටියේ විත්තියේ නීතිඥවරුන්ට සාකච්ඡා කිරීමට අවශ්‍ය නම් ඕනෑම අවස්ථාවක නීතිපති දෙපාර්තමේන්තුවට පැමිණෙන ලෙසයි. අතිරේක සොලිසිටර් ජනරාල්වරයා අධිචෝදනා කියවා ඒවා යේ ගම්‍ය වන තේරුම් අධිකරණයට ඉදිරිපත් කිරීමට අවසර ඉල්ලා සිටියේය. [18] ඒ අනුව ඉහත කී කරුණුවලට අධිකරණය අවසර ලබා දුන්නේය. එකී ලේඛනය මුද්‍රණය කළහොත් එක් චූදිතයෙකුට පිටු 1900ක් පමණ වැය වන බවත් එබැවින් එය විද්‍යුත් තැපෑලෙන් නීතිඥවරුන් වෙත යැවීමට හෝ සීඩී තැටියකින් ලබා දීමට හැකි බවත් අතිරේක සොලිසිටර් ජනරාල්වරයා අධිකරණයට දන්වා සිටියේය.[19] එපමණක් නොව මඩකලපුව මහේස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාට අදාළ නඩු ගොනු මෙම අධිකරණයට භාරදෙන ලෙසටද අධිකරණය නියෝගයක් කළේය. පැමිණිල්ලේ සාක්ෂි අංක 1, මහාචාර්ය රොහාන් ගුණරත්න සහ සාක්ෂි අංක 2, සුරේෂ් සලේ යන සාක්ෂිකරුවන් සාක්ෂි මෙහෙයවීම සඳහා කැඳවන බව පැමිණිල්ල අධිකරණයට දැන්විය. මෙම නඩුව 2023 ජනවාරි 4 සහ 5 යන දිනවල නඩු විභාගයට නියම කරන ලදී. [20]

2023 ජනවාරි 04 වැනි දින 01 සහ 10 වැනි විත්තිකරුවන් වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා අධිකරණයට අයැදුම්පතක් ඉදිරිපත් කරමින් කියා සිටියේ විත්ති වාචක ඉදිරිපත් කිරීමට සහ සාධාරණ නඩු විභාගයක් පැවැත්වීමට නම් ජනාධිපති කොමිෂන් සභා වාර්තාව ඇතුළු ලිපි ලේඛන අවශ්‍ය බවයි. [21] කෙසේ වෙතත්, අධිකරණය මෙම අයදුම්පත ප්‍රතික්ෂේප කළේය. 2 වන සාක්ෂිකරු වන සුරේෂ් සලේ තාවකාලිකව නිදහස් කරන ලදී. 14 වැනි විත්තිකරුට ක්ෂය රෝගය වැළඳී ඇති බැවින් ඔහු අධිකරණයට ඉදිරිපත් නොකළ නිසා අධිකරණ කටයුතු ඉදිරියට පවත්වාගෙන යාමට නොහැකි විය. [22]

2023 ජනවාරි 05 වැනි දින, ඇප සම්බන්ධයෙන් විත්තිකරුවන්ගේ ලිඛිත දේශන සලකා බැලීමෙන් පසු අධිකරණය සියලු විත්තිකරුවන්ට ඇප ලබාදීම ප්‍රතික්ෂේප කළේය. [23] 2023 පෙබරවාරි 01 වැනි දින අතිරේක සොලිසිටර් ජනරාල්වරයා විත්තිකරුවන්ගේ නීතිඥවරුන් නීතිපති දෙපාර්තමේන්තුවේදී රැස්වී නඩුව කඩිනම් කිරීම සඳහා නඩුවේ පිළිගැනීම් පිළිබඳව සාකච්ඡා කරන ලෙස යෝජනා කළ අතර ඊට නීතිඥවරු එකඟ වූහ. 2023 පෙබරවාරි 6, 9 සහ 10 යන දිනයන් මේ සඳහා යෝජනා කරගන්නා ලදී. [24] 17 වන විත්තිකරු 2023 පෙබරවාරි 5 වන දින බන්ධනාගාරය තුළ ප්‍රතිකාර ලබමින් සිටියදී මිය ගිය බව මැගසින් බන්ධනාගාරය 2023 පෙබරවාරි 28 වන දින අධිකරණයට දන්වා සිටියේය. නීතිපති දෙපාර්තමේන්තුව වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරු ඇතැම් මුද්‍රණ දෝෂ සහ 17 වැනි විත්තිකරුගේ මරණය හේතුවෙන් අධිචෝදනා සංශෝධනය කිරීමට අධිකරණයෙන් අවසර ඉල්ලා සිටියේය. [25]

එක් තිරයක සිංහලෙන් ප්‍රදර්ශනය කරමින් සහ එහි පරිවර්තනය දෙමළෙන් අනෙක් තිරයේ ප්‍රදර්ශනය කරමින්, තිර දෙකක් භාවිතා කරමින් 2023 මාර්තු 31 වැනි දින සිංහල සහ දමිළ භාෂාවලින් අධිචෝදනා කියවා දීම ආරම්භ කරන ලදී. [26] එලෙස අධිචෝදනා කියවා දීම මැයි 24 වැනි දින සහ ජූනි 02 වැනි දින ද අඛණ්ඩව සිදු විය. මේ වන විට අධිචෝදනා 4520ක් කියවා දී අවසන් අතර, එම අධිචෝදනා සම්බන්ධයෙන් තමන් නිවැරදිකරු බව සියලුම චූදිතයන් ප්‍රකාශ කර ඇත.[27] තවදුරටත් අධිචෝදනා කියවා දීම සඳහා ජූලි 11, අගෝස්තු 02 සහ අගෝස්තු 07 වැනි දිනවල පස්වරු 2ට නඩුව කැඳවන මෙන් නියම කර ඇත.[28]

## 2 වන කොටස: පාස්කු ප්‍රහාරය වළක්වාගැනීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් හිටපු පොලිස්පතිට එරෙහි නඩුව – HC (TAB) 2900/21

පාස්කු ත්‍රස්ත ප්‍රහාරය වැළැක්වීමට අපොහොසත් වීම සහ රාජකාරී පැහැර හැරීම සම්බන්ධයෙන් හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර මහතාට එරෙහිව අධිචෝදනා ගොනුකර තිබූ නඩුව 2022 ජනවාරි මස 18 වනදා[29] යළි කොළඹ මහාධිකරණ ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල හමුවේ කැඳවන ලදී. [30] මෙදින බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා මෙම නඩුවේ සාක්ෂි ලබා දුන්නේය. [31] දේශබන්දු තෙන්නකෝන් මහතා සඳහන් කළේ 2019 අප්‍රේල් 9 වැනි දින රාජ්‍ය බුද්ධි සේවය විසින් ජාතික බුද්ධි දෙපාර්තමේන්තුවට යොමු කළ තොරතුරු ඉහළ සිට පහළට යොමු වූ තවත් එක් තොරතුරක් බවට පත්ව ඇති බවයි. [32] ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා ප්‍රකාශ කළේ පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් ලබාගෙන ඇති තොරතුරු ස්ථිර නොවන බවයි. [33] බුද්ධි තොරතුරු සම්බන්ධයෙන් වගකිව යුතු සියලුම දෙපාර්තමේන්තු ඒකාබද්ධව සාකච්ඡා කර කඩිනම් පියවර ගත්තේ නම් පාස්කු ප්‍රහාරයේ අනුපිළිවෙල බොහෝ දුරට වළක්වා ගැනීමට හැකිවනු ඇතැයි ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කළේය. [34] සාක්ෂිකරු දින තුනක නිවාඩුවක් ඉල්ලා තිබී ඇති අතර අප්‍රෙල් 21 දින නිවාඩු ලබා සිටියේය. [35] එබැවින් නිවාඩු කාලය තුළ සාක්‍ෂිකරු වෙනුවෙන් පෙනී සිටීම සඳහා බස්නාහිර දකුණ භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා පත් කරන ලදී. [36] තවද, සාක්‍ෂිකරු ප්‍රකාශ කළේ තමා නිවාඩු ලබා සිටියද පාස්කු සිද්ධිය පිළිබඳව දැනගත් පසු තමාගේ බල ප්‍රදේශයට පැමිණි බවයි. [37]

2022 ජනවාරි 18 වැනි දින සාක්ෂිකරු බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගෙන් හරස් ප්‍රශ්න ඇසීමට (විත්තියේ නීතිඥවරයා විසින්) ලක් කරන ලදී. [38] එහිදී සාක්ෂිකරු විසින් 2019 අප්‍රේල් 9 වැනි දින පොලිස්පතිවරයා වෙත යවන ලද ලිපියක් හඳුනා ගන්නා ලදී. [39] හිටපු පොලිස්පතිවරයා විසින් මෙම ලේඛනය නිලධාරීන් හතර දෙනෙකුට යවා ඇති බව අනාවරණය විය. [40] හිටපු පොලිස්පතිවරයා අදාළ අංශ වෙත දැනුම් දී තිබූ නිසා තමාට මෙම තොරතුරු ලැබුණු බව සාක්ෂිකරු පිළිගත්තේය. [41]

2022 ජනවාරි 19 වැනි දින මෙම නඩුව කැඳවූ අවස්ථාවේදී රාජ්‍ය බුද්ධි සේවයේ හිටපු ප්‍රධානී නිලන්ත ජයවර්ධන, පූජිත් ජයසුන්දර සහ විත්තිකරුවන්ට එවන ලද බුද්ධි වාර්තාවල අඩංගු වූ, සාක්ෂි ලෙස සටහන් කර තිබූ ලේඛන 38ක මුල් පිටපත් ඉදිරිපත් කිරීම සඳහා පැමිණිල්ල විසින් සාක්ෂිකරුවෙකු කැඳවනු ලැබීය.[42] සාක්ෂිකරු මාර්ගයෙන් මුල් පිටපත් සලකුණු කළ අතර, සමහර ලේඛන අසම්පූර්ණ සහ එකිනෙකට පටහැනි බව අධිකරණය නිරීක්ෂණය කළේය. [43] පරීක්ෂණයක් සිදුකරන විට ඊට අදාළ සම්පූර්ණ වාර්තා අධිකරණයට ඉදිරිපත් කිරීමට පොලිසිය සහ නීතිපති දෙපාර්තමේන්තුව පියවර ගත යුතු බව ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ලේ විනිසුරු ආදිත්‍ය පටබැඳිගේ මහතා විවෘත අධිකරණයේදී ප්‍රකාශ කර ඇතැයි වාර්තා වේ. [44] මෙමගින් අපරාධ විමර්ශන ක්‍රියාපටිපාටිය පිළිබඳව සාමාන්‍ය ජනතාව තබා ඇති විශ්වාසය බිඳවැටීමක් සිදුවනු ඇතැයි විනිසුරු ආදිත්‍ය පටබැඳිගේ ද ප්‍රකාශ කර තිබූ බව වාර්තා වේ. [45] තවද මෙම නඩුවේ පැමිණිල්ල විසින් සලකුණු කර ඇති ලිපි ලේඛන පරීක්ෂා කිරීමේදී පැමිණිල්ල විසින් මෙම නඩුව ගොනු නොකළ යුතුව තිබූ බව විශේෂ ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ලේ සභාපති විනිසුරු නාමල් බලල්ල මහතා විවෘත අධිකරණයේදී ප්‍රකාශ කළ බවද වාර්තා වේ. [46]

2022 ජනවාරි 20 වැනි දින මෙම නඩුව කොළඹ මහාධිකරණ ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල[47] හමුවේ යළි කැඳවූ අවස්ථාවේදී පැමිණිල්ල වෙනුවෙන් දිවුරුම් දී සාක්ෂි සඳහා අධිකරණ රෙජිස්ටාර්වරයා අධිකරණයට කැඳවනු ලැබීය. [48] පැමිණිල්ලේ සාක්ෂි සහ ලේඛන සලකුණු කිරීමෙන් පසුව, විත්තිකරුවන් කැඳවන්නේද නැද්ද යන්න පිළිබඳ නියෝගයක් ලබා දීම සඳහා නඩුව 2022 පෙබරවාරි 18 දිනට නියම කරන ලදී. [49]

මෙම නඩුව 2022 පෙබරවාරි මස 18 වන දින කොළඹ මහාධිකරණ විනිසුරු මඩුල්ල හමුවේ කැඳවනු ලැබූ අතර, හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා නඩුවෙන් විත්ති වාචක තොරව නිදොස් කොට නිදහස් කරන ලෙසට[50] විනිසුරු මඩුල්ල ඒකමතිකව තීරණය කර නියෝග කරන ලදි[51] . මෙම දිනයේ දී අධිකරණය විසින් කරන ලද ලිඛිත නියෝගයේ දක්වා ඇති කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත්ය.

❖ **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එරෙහිව පූජිත් සේනාධි බණ්ඩාර ජයසුන්දර HC (TAB) 2900/2021 නඩුවේ හඳුනාගෙන ඇති ප්‍රධාන කරුණු පිළිබඳ සංක්ෂිප්තය (විත්තිය කැඳවීමට අදාළ නියෝගය)**

- මෙම නඩුවේ චූදිතයා වූ පූජිත් ජයසුන්දර මහතාට එරෙහිව චෝදනා 855ක් තිබූ අතර, එම චෝදනා දණ්ඩ නීති සංග්‍රහයේ 102 වගන්තිය සමග කියවිය යුතුය. [52] ඒ අනුව සැබෑ ප්‍රශ්නය වන්නේ මෙම නඩුවේ චෝදනා 855ක් තිබුණද, දණ්ඩ නීති සංග්‍රහයේ 102 වගන්තියට අනුව **අනුබලයක්** තිබේද යන්නයි.
- 'ක්‍රියාව අනුබල දෙන්නේ නම්' යන නෛතික තත්ත්වය සලකා බැලීමේදී, අනුග්‍රාහකයෙකු යනු "ඕනෑම **ක්‍රියාවකින්** හෝ **නීති විරෝධී අතපසුවීමකින්**, එම දෙය කිරීමට <u>හිතාමතාම ආධාර කරන</u>" අයෙකු බව සැලකිල්ලට ගැනීම වැදගත්ය. [53] ඒ අනුව අනුබල දීම හා නීති විරෝධී අතපසුවීම අතර සම්බන්ධය පැහැදිලිය.
- පූජිත් ජයසුන්දර මහතා අතපසු කිරීම සම්බන්ධයෙන් වරදකරු ලෙස සැලකීම සඳහා සැලකිය යුතු වගකීමක් සහිත තනතුරක සිටි බව සනාථ කිරීමට බලගතු සහ සාධනීය සාක්ෂි නොමැති බව විනිසුරු මඩුල්ලේ ස්ථාවරය බව අධිකරණයේ ලිඛිත නියෝගයේ සඳහන් වේ. [54] විත්ති පාර්ශවය අතපසුවීමක් සිදුවී ඇති බව ප්‍රකාශ කිරීම පමණක් ප්‍රමාණවත් නොවන අතර, චූදිතයා එම වගකීමෙන් ඉටුකිරීමට අතපසු කර ඇති දේ සහ හෝ එම වගකීමෙන් කිරීමට පැහැර හැර ඇති දේ සනාථ කිරීමට බලගතු සහ ප්‍රබල සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. [55] මෙහිදී පැමිණිල්ල විසින් එය නිසි ලෙස ඔප්පු කිරීමට පියවර නොගෙන අසාර්ථක වී ඇත. [56]
- මෙම නඩුවේ සාක්ෂිකරුවන් 1200 ක් පමණ නම් කර ඇතත්, නඩු විභාගයේදී සාක්ෂි දීමට කැඳවා තිබුණේ සාක්ෂිකරුවන් 6 දෙනෙකු පමණ[57] වන අතර එය ඉතා සුළු සංඛ්‍යාවකි.
- ලිඛිත නියෝගයේ සඳහන් වන්නේ, **"...මෙම නඩුවේ තොරතුරු වාර්තාව ඉදිරිපත් කිරීමට පෙර නීතිපතිවරයා දෙවරක් සිතා බැලිය යුතුව තිබූ බව අපි විශ්වාස කරමු. "** ලෙසයි[58]
- ලිඛිත නියෝගයේ සඳහන් වන්නේ, "... ඉහත සඳහන් කළ කරුණු සහ නෛතික තත්ත්වයන් තුළ අවම වශයෙන් ප්‍රධාන සාක්‍ෂිකරුවන් විසින් සාක්ෂි ඉදිරිපත් කර අවසන් වූ පසුව හෝ චෝදනා සම්බන්ධයෙන් ඉදිරියට යනවාද නැද්ද යන්න සලකා බැලීමට නීතිපතිවරයාට අවස්ථාව තිබුණද පැමිණිල්ල එම වාසිය ලබා ගෙන නැති බව අපගේ ස්ථාවරයයි. " [59]
- උගත් මහාධිකරණ විනිසුරු A.K.M පටබැඳිගේ මහතාගේ නියෝගයේ පහත පරිදි දක්වා ඇත, **"... ගැටලුවේ සංවේදීතාව මත පදනම්ව ඕනෑම පුද්ගලයෙකුට (සාක්ෂි නොමැතිව) එරෙහිව නඩු පැවරීම අනුමත කළ නොහැක. "** [60]
- ඒ අනුව විත්තිකාර පූජිත් ජයසුන්දර මහතා ගේ විත්ති වාචක කැ ඳවීමකින් තොරව සියලු චෝදනාවලින් නිදහස් කිරීමට ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල විසින් විත්ති වාචක කැඳවීමට අදාළ මෙම නියෝගයෙන් තීරණය කර ඇත. [61]
- හිටපු රාජ්‍ය බුද්ධි සේවයේ ප්‍රධානී නිලන්ත ජයවර්ධන මහතාගේ (අංක 1 පැමිණිල්ලේ සාක්ෂිකරු) පාර්ශවයෙන් අතපසුවීමක් සිදුවී ඇති බවට උගත් මහාධිකරණ විනිසුරු ඒ. කේ. එම්. පටබැඳිගේ සිය නියෝගයෙන් ඉඟි කර ඇත. ඒ පිළිබඳ වැඩි විස්තර සඳහා, නියෝගයේ 231, 232, 233 සහ 235 ඡේද බලන්න.

දැනට මෙම නඩුව ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියෙහි අභියාචනා කර ඇත. එය 2023 මාර්තු 13 වැනි දින කැඳවනු ලැබූ නමුත් එය 2023 ජූලි 4, 5, 11 සහ 12 යන දිනවලට කල් තබන ලදී. [62]

## 3 වන කොටස: පාස්කු ප්‍රහාරය වැළැක්වීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් හිටපු ආරක්ෂක ලේකම්වරයාට එරෙහි නඩුව - HC (TAB) 2899/2021

2022 ජනවාරි 18 වැනි දින කොළඹ මහාධිකරණයේ ත්‍රිපුද්ගල මහාධිකරණය හමුවේ මෙම නඩුව විභාගයට ගත් අවස්ථාවේදී අධිකරණ රෙජිස්ට්‍රාර්වරයා සාක්ෂි ලබාදුන් අතර[63] පැමිණිල්ල විසින් පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තා සහ අධිකරණ වෛද්‍ය නිලධාරීවරයාගේ වාර්තා සාක්ෂි වශයෙන් එකින් එක සටහන් කරන ලදී. [64]

2022 ජනවාරි 19 වැනි දින මෙම නඩුව ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල හමුවේ කැඳවූ අවස්ථාවේදී[65] පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තා සහ රජයේ රස පරීක්ෂක වාර්තා අධිකරණයට ඉදිරිපත් කරන ලදී. [66] පැමිණිල්ල වෙනුවෙන් පෙනී සිටි නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් සුදර්ශන ද සිල්වා මහතා අධිකරණයට දන්වා සිටියේ ඔවුන් වෙනුවෙන් සාක්ෂිකරුවන් කැඳවීම පැමිණිල්ල විසින් අවසන් කර ඇති බවයි. [67] පාස්කු ප්‍රහාරයට අදාළව හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු මහතාට එරෙහි නඩුවේ ඔහු නිදොස් කොට නිදහස් කරන්නේද නැතහොත් ඔහුගේ විත්ති වාචක කැඳවන්නේද යන්න පිළිබඳ නියෝගය 2022 පෙබරවාරි 18 වෙනිදා නිකුත් කරන බව අද දින ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල දැනුම් දුන්නේය. [68]

මෙම නඩුව 2022 පෙබරවාරි 18 වැනි දින කොළඹ මහාධිකරණ විනිසුරු මඩුල්ල හමුවේ කැඳවනු ලැබූ අතර, ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඩුල්ල විසින් හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු මහතා වෙනුවෙන් විත්ති වාචක තොරව ඔහුව නිදොස් කොට නිදහස් කිරීමට[69] ඒකමතික නියෝගයක් නිකුත් කරන ලදී. [70] මෙම දිනයේ දී අධිකරණය විසින් කරන ලද ලිඛිත නියෝගයේ දක්වා ඇති කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත්ය.

❖ **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව හේමසිරි ප්‍රනාන්දු HC (TAB) 2899/2021 නඩුවේ හඳුනාගෙන ඇති ප්‍රධාන කරුණු පිළිබඳ සංක්ෂිප්තය (විත්තිය කැඳවීමට අදාළ නියෝගය)**

- මෙම නඩුවේ විත්තිකරු වූ හේමසිරි ප්‍රනාන්දු මහතාට එරෙහිව චෝදනා 855ක් තිබුණද, එම චෝදනා දණ්ඩ නීති සංග්‍රහයේ 102 වන වගන්තිය සමඟ කියවිය යුතුය [71]. ඒ අනුව සැබෑ ගැටලුව වන්නේ මෙම නඩුවේ චෝදනා 855ක් තිබුණද දණ්ඩ නීති සංග්‍රහයේ 102 වගන්තිය ප්‍රකාරව අනුබලදීමක් තිබේද යන්නයි.

- 'ක්‍රියාව අනුබල දෙන්නේ නම්' යන නෛතික තත්ත්වය සලකා බැලීමේදී [72]', නුග්‍රාහකයෙකු යනු "ඕනෑම **ක්‍රියාවකින්** හෝ **නීති විරෝධී අතපසුවීමකින්**, එම දෙය කිරීමට <u>හිතාමතාම ආධාර කරන</u>" අයෙකු බව සැලකිල්ලට ගැනීම වැදගත්ය.[73].

- හේමසිරි ප්‍රනාන්දු මහතා මහතා අතපසු කිරීම සම්බන්ධයෙන් වරදකරු ලෙස සැලකීම සඳහා සැලකිය යුතු වගකීමක් සහිත තනතුරක සිටි බව සනාථ කිරීමට බලගතු සහ සාධනීය සාක්ෂි නොමැති බව විනිසුරු මඩුල්ලේ ස්ථාවරය බව අධිකරණයේ ලිඛිත නියෝගයේ සඳහන් වේ [74]. විත්ති පාර්ශවය අතපසුවීමක් සිදුවී ඇති බව ප්‍රකාශ කිරීම පමණක් ප්‍රමාණවත් නොවන අතර, චූදිතයා එම වගකීමෙන් ඉවුකිරීමට අතපසු කර ඇති දේ සහ හෝ එම වගකීමෙන් කිරීමට පැහැර හැර ඇති දේ සනාථ කිරීමට බලගතු සහ ප්‍රබල සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. [75]. මෙහිදී පැමිණිල්ල විසින් එය නිසි ලෙස ඔප්පු කිරීමට පියවර නොගෙන අසාර්ථක වී ඇත [76].

- මෙහිදී හේමසිරි ප්‍රනාන්දු මහතා මාධ්‍ය වෙත කළ ප්‍රකාශය පිළිබඳව ද මෙහිදී සාකච්ඡාවට ලක්විය. කෙසේ වෙතත් එම ප්‍රකාශය "... යම් යම් දේවල් සිදුවෙමින් පවතින බව අපි දැනගෙන හිටියා..." යන ප්‍රකාශය විත්තිකරු විසින් මාධ්‍ය වෙත ප්‍රකාශ කළද[77], එය චෝදනාවල දක්වා ඇති ප්‍රහාර ගැන සඳහන් කරන බවට පැමිණිල්ල විසින් අධිකරණයට ඒත්තු ගන්වා නැත.[78]

- ඉදිරිපත් කර ඇති සාක්ෂිවලට අනුව මෙම සිද්ධියට අදාළ ප්‍රහාර සම්බන්ධයෙන් ප්‍රමාණවත් නිශ්චිත බුද්ධි තොරතුරු සොයා ගැනීමට රාජ්‍ය බුද්ධි සේවය අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය වේ [79].

- මෙම නඩුවේ සාක්ෂිකරුවන් 1200 ක් පමණ නම් කර ඇතත්, නඩු විභාගයේදී සාක්ෂි දීමට කැඳවා තිබුණේ සාක්ෂිකරුවන් 7 දෙනෙකු පමණ [80], වන අතර එය ඉතා සුළු සංඛ්‍යාවකි.

- ලිඛිත නියෝගයේ සඳහන් වන්නේ, **"...මෙම නඩුවේ තොරතුරු වාර්තාව ඉදිරිපත් කිරීමට පෙර නීතිපතිවරයා දෙවරක් සිතා බැලිය යුතුව තිබූ බව අපි විශ්වාස කරමු. "** ලෙසයි.**[81]**

- එම ලිඛිත නියෝගයේ, "... ඉහත සඳහන් කළ කරුණු සහ නෛතික තත්ත්වයන් තුළ අවම වශයෙන් ප්‍රධාන සාක්ෂිකරුවන් විසින් සාක්ෂි ඉදිරිපත් කර අවසන් වූ පසුව හෝ චෝදනා සම්බන්ධයෙන් ඉදිරියට යනවාද නැද්ද යන්න සලකා බැලීමට නීතිපතිවරයාට අවස්ථාව තිබුණද පැමිණිල්ල එම වාසිය ලබා ගෙන නැති බව අපගේ ස්ථාවරයයි" යනුවෙන් එහි සඳහන් වේ.[82]"

- උගත් මහාධිකරණ විනිසුරු A.K.M පටබැඳිගේ මහතාගේ නියෝගයේ පහත පරිදි දක්වා ඇත, **"... ගැටලුවේ සංවේදීතාව මත පදනම්ව ඕනෑම පුද්ගලයෙකුට (සාක්ෂි නොමැතිව) එරෙහිව නඩු පැවරීම අනුමත කළ නොහැක.[83]"** "..."... පැමිණිල්ල විසින්ම ඉදිරිපත් කරන ලද සාක්ෂි වලට අනුව, ස්වාධීන තීරණ ගැනීමට ඉඩ සලසන වාතාවරණයක් නිර්මාණය කිරීම වෙනුවට සිද්ධියක් සිදු වූ පසු ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ලෙස කටයුතු කළ විත්තිකරුවන් වැනි රාජ්‍ය නිලධාරීන් මත වගකීම දේශපාලන බලධාරීන් විසින් පැටවීම අසාධාරණ බව මම ප්‍රකාශ කරමි." "පැමිණිල්ල විසින් මෙහෙයවනු ලබන සාක්ෂි සැලකිල්ලට ගනිමින්, විත්තකරුගේ අතපසුවීමක් සනාථ කිරීම සඳහා කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කර නොමැති බව මම තීරණය කරමි"[84] ඒ අනුව, සාපරාධී අතපසුවීමක් තබා හුදු අතපසුවීමක් ඔප්පු කිරීමට පැමිණිල්ල අධිකරණය හමුවේ අපොහොසත් වී ඇත.

- ඒ අනුව විත්තිකාර හේමසිරි ප්‍රනාන්දු මහතාගේ විත්ති වාචක කැඳවීමකින් තොරව සියලු චෝදනාවලින් නිදොස් කොට නිදහස් කිරීමට ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල විසින් මෙම නියෝගයෙන් තීරණය කර ඇත [85].

- හිටපු රාජ්‍ය බුද්ධි සේවයේ ප්‍රධානී නිලන්ත ජයවර්ධන මහතාගේ (පැමිණිල්ලේ අංක 1 සාක්ෂිකරු) පාර්ශවයෙන් අතපසුවීමක් සිදුවී ඇති බවට උගත් මහාධිකරණ විනිසුරු ඒ. කේ. එම්. පටබැඳිගේ සිය නියෝගයෙන් ඉඟි කර ඇත. ඒ පිළිබඳ වැඩි විස්තර සඳහා, නියෝගයේ 245 සහ 246 ඡේද බලන්න.

**දැනට මෙම නඩුව ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියෙහි අභියාචනා කර ඇත. 2023** මාර්තු 13 වැනි දින නඩුව කැඳවූ නමුත් **එය** 2023 **ජූලි** 4, 5, 11, **සහ** 12 **යන දිනවලට කල් තබන ලදී.** [86]

## 4 වන කොටස: පාස්කු ප්‍රහාරයට අදාළ මූලික අයිතිවාසිකම් නඩු – SC FR 163/2019, SC FR 165/2019, SC FR 166/2019, SCFR 184/2019, SC FR 188/2019, SC FR 191/2019, SC FR 193/2019, SC FR 195/2019, SC FR 196/2019, SC FR NO. 197/19, SC FR 198/2019, SCFR 293/2019

2022 ජුනි මස 9 වන දින පහත සඳහන් සාක්ෂි සලකා බලන ලදී. 2015 මහ මැතිවරණයෙන් පසු 2015 සැප්තැම්බර් මස 04 වන දින සිට 2018 ඔක්තෝම්බර් මස 26 වන දින දක්වා අලුතින් පිහිටුවන ලද ජාතික ආණ්ඩුවේ අග්‍රාමාත්‍යවරයා ලෙස රනිල් වික්‍රමසිංහ මහතා තේරී පත්වූ බව නිරීක්ෂණය විය. පසුගිය ඔක්තෝම්බර් මස 20 වැනි දින ඔහු ජාතික ආණ්ඩුවෙන් ඉවත් විය. අතිගරු ජනාධිපතිතුමා විසින් ගැසට් නිවේදනයක් මගින් අග්‍රාමාත්‍යවරයා ධුරයෙන් ඉවත් කර මහින්ද රාජපක්ෂ මහතා අග්‍රාමාත්‍යවරයා ලෙස පත් කරන ලදී. රනිල් වික්‍රමසිංහ මහතා විසින් පහත සඳහන් චෝදනා එල්ල කරන ලදී;

"...මෙම සිදුවීම පුරාවටම, අතිගරු ජනාධිපතිතුමාගේ හැසිරීම නීති විරෝධී බව මම තරයේ කියා සිටිමි. පිහිටුවන ලදැයි කියන නව රජය පාර්ලිමේන්තුවේ බහුතරයේ විශ්වාසය නොතැබූ බව තහවුරු කිරීමට ද මම උත්සාහ කරමි. පාර්ලිමේන්තුව විසුරුවා හැරීම අභියෝගයට ලක්කරමින් මෙම අධිකරණයට පෙත්සම් මාලාවක් ගොනු කෙරුණා. ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයෙන් යුත් තථ්‍ය රජයේ ක්‍රියාකාරිත්වය වළක්වමින් ඔබගේ අතිගරු අධිකරණය විසින් අතුරු සහනයක් ලබා දෙන ලදී. මෙම කාලය තුළ රනිල් වික්‍රමසිංහ මහතා නැවත අග්‍රාමාත්‍ය ධුරයට පත් කළහොත් තමන් තවත් එක් දිනක්වත් එම ධුරයේ රැඳී නොසිටින බවට ජනාධිපතිවරයා ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිහිපයක් ම සිදු කළා."

එමෙන්ම නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා සහරාන්ට එරෙහිව විවෘත වරෙන්තුවක් ලබාගෙන ඇති බවටද චෝදනා එල්ල විය. 2018 ජුලි 02 වැනි දින විවෘත වරෙන්තුව නිකුත් කිරීමෙන් පසු සහරාන් අතුරුදන් වූ අතර නියෝජ්‍ය පොලිස්පතිවරයාට ඔහු කාත්තන්කුඩි, කුලියාපිටිය හෝ කුරුණෑගලදී සොයා ගැනීමට නොහැකි විය. ඔහු විදේශගත වී ඇත්දැයි සැකයක් මතුව ඇති බැවින් ඔහු සොයා දෙන ලෙස නියෝජ්‍ය පොලිස්පතිවරයා ජාත්‍යන්තර පොලිසිය (ඉන්ටර්පෝල්) වෙත දැනුම් දුන්නේය. ඉන් පසුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දැනගන්නට ලැබුණේ ඔහු ඉන්දියාවේ සිටින බවයි. ජාතික තවුහීද් ජමාත් (NTJ) නායකයාට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඉල්ලා ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයේ (TID) විසින් මෙම ලිපිගොනුව සකස් කර නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කරන ලදී. 2018 ඔක්තෝබර් 25 වැනිදා ප්‍රභූ ඝාතන කුමන්ත්‍රණයක් සම්බන්ධයෙන් නාලක ද සිල්වා මහතා අත්අඩංගුවට ගනු ලැබීය. [87]

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **35(1)** වගන්තිය වත්මන් ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාට එරෙහිව අදාළ කර ගත හැකිද යන්න පිළිබඳව සිය ස්ථාවරය ප්‍රකාශ කිරීම සඳහා **2022** ජූලි **26** වැනි දින පාර්ශවය වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරුන් සහ වගඋත්තරකරුවන් වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරුන් අධිකරණයට පැමිණ සිටියහ. මෙම නීතිමය කරුණ සම්බන්ධයෙන් වාචික කරුණු දැක්වීමක් අගෝස්තු **2** වැනිදා සිදුකිරීමට සියලුම නීතිඥවරු එකඟ වූහ. කෙසේ වෙතත් ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාෆා මහතාට එදින පෙනී සිටීමට නොහැකි විය. එබැවින් ඔහුගේ කරුණු දැක්වීම **2022** ජුලි **27** වැනි දින සිදු කරන ලෙස අධිකරණය නියම කළේය. ශ්‍රී ලංකා නීතිඥ සංගමය ඇතුළු පෙත්සම්කරුවන්ගේ පෙත්සම් ගොනු කරනු ලැබුවේ වින්දිතයින් වෙනුවෙන් සෘජුව හෝ වක්‍රව වගකිව යුතු පාර්ශවයන්ට නඩු පැවරීමට**,** වගකිව යුතුබව සහ වන්දි ඉල්ලා සිටීමට ය**.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **35** වැනි වගන්තිය යටතේ පවතින මුක්තිය සම්බන්ධයෙන් වන විධිවිධාන හිටපු **අග්‍රාමාත්‍ය** රනිල් වික්‍රමසිංහ මහතාට අදාළ නොවන බව පවසමින් ජනාධිපති

නීතිඥ සාලිය පීරිස් සහ ජනාධිපති නීතිඥ සංජීව ජයවර්ධන යන මහත්වරු විරෝධතා ඉදිරිපත් කළහ. මෙම නඩුව වැඩිදුර විභාගය සඳහා 2022 අගෝස්තු මස 02 වන දින කැඳවීමට නියමිත විය. [88]

2022 අගෝස්තු 02 වැනි දින,[89] **ජනාධිපති නීතිඥ සාලිය පීරිස් මහතා සිය කරුණු ඉදිරිපත් කළේ මෙසේය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 35(1) වගන්තිය** ප්‍රකාරව ජනාධිපතිවරයා ලෙස ධූරය දරන කවර වූ හෝ තැනැත්තෙකු විසින් පෞද්ගලික තත්ත්වයෙහිලා හෝ නිල තත්ත්වයෙහිලා හෝ කරන ලද හෝ නොකර හරින ලද කිසිවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කිසිම අධිකරණය හෝ විනිශ්චය අධිකාරයක කිසිම නඩු කටයුත්තක් පැවරීම හෝ පවත්වාගෙන යාම නොකළ යුතු බව ඔහු ප්‍රකාශ **කළේය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 35(1) වගන්තියේ විධිවිධාන පිළිබඳව ද උගත් ජනාධිපති නීතිඥවරයා අධිකරණයේ අවධානය යොමු කළේය. මෙම ක්‍රියාමාර්ගය ඉදිරියට ගෙන යා හැකිද යන්න තීරණය කිරීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 35(1) වගන්තිය සහ ඊට අදාළ වගන්ති 20 වැනි ව්‍යවස්ථා සංශෝධනය අනුව අර්ථකථනය කළ යුතු බව ඔහු අධිකරණයට ඉදිරිපත් කළේය.**[90]

2022 ඔක්තෝම්බර් මස 04 වන දින මෙම කරුණු දැක්වීම පසුගිය නඩු විභාගයේ සිට අඛණ්ඩව පැවැත්විණි. එම ලේඛනයේ 109 වැනි පිටුවේ A9 ලෙස සලකුණු කර ඇති ලේඛනය, සිසිර මෙන්ඩිස් මහතා විසින් පොලිස්පතිවරයා වෙත යොමු කරන ලද ලිපියක් වන අතර එය අධිකරණයේ සඳහන් විය. පල්ලි කිහිපයකට සහ එක්තරා විදේශීය තානාපති කාර්යාලයකට ප්‍රහාර එල්ල කිරීමට සැලසුම් කළ ජාතික තව්හිද් ජමාත් (NTJ) සහචරයින් සම්බන්ධයෙන් රාජ්‍ය බුද්ධි සේවා වෙතින් ලද තොරතුරු පිළිබඳ තොරතුරු මෙම ලිපියට ඇතුළත් විය. ප්‍රහාර සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම සඳහා යවන ලද සිසිර මෙන්ඩිස් මහතා විසින් කරන ලද අනුමත කිරීමක් වන ලේඛනයේ 157 වන පිටුවේ සමකාලීන ලිපියක් ද ඇතුළත් විය.

රජය වෙනුවෙන් පෙනී සිටි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් (SDSG) දැනටමත් විනිසුරුවරුන් වෙත ඉදිරිපත් කර ඇති තවත් කුඩා ලේඛනයක් ගැන සඳහන් කළේය. එම කුඩා ලේඛනයේ ඡායා පිටපත් කරන ලද පිටුවක දෙවන ඡේදයේ 1 වන සාරාංශයේ අපරාධ නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන අඩංගු විය. 107 වන වගන්තිය සහ 1,2,3 උප වගන්ති උපුටා දක්වමින් පොලිසිය විසින් සංජානනීය වරදක් වැලැක්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් සනාථ කරන ලදී. පොලිස් ආඥා පනතේ 156 වන වගන්තිය ද මේ සම්බන්ධයෙන් සඳහන් විය. ‘නීතිය බලාත්මක කිරීමේ නිලධාරීන් අපරාධයක් වැලැක්වීම සඳහා උපරිම හැකියාව භාවිතා කළ යුතු බව’ ඔප්පු කිරීම සඳහා 1979 එක්සත් ජාතීන්ගේ යෝජනාවේ 17 වන වගන්තිය උපුටා දක්වමින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්වරයා සඳහන් කළේය. මෙම යෝජනාවේ "මැදිහත්වීම" යන වචන භාවිතය වැළැක්වීම සම්බන්ධයෙන් වැදගත් අර්ථයක් අඩංගු බව ඔහු සිය තර්කය තවදුරටත් ඉදිරියට ගෙන යමින් ප්‍රකාශ කර සිටියේය. එයින් අදහස් කරන්නේ අපරාධයක් වැළැක්වීම සඳහා මැදිහත්වීමයි.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා කියා සිටියේ සිසිර මෙන්ඩිස් සහ නිලන්ත ජයවර්ධන යන මහත්වරුන් පරිපාලනමය අර්ථයෙන් සාධාරණව ක්‍රියා කළ බවට තොරතුරු අවශ්‍ය නිලධාරීන්ට ලබාදී ඇති බවයි. *AP province V Winsbury* සඳහන් කිරීමෙන් රාජ්‍ය නිලධාරියෙකුගේ මෙම නිරවද්‍යතාව හෝ සාධාරණත්වය තවදුරටත් සනාථ කරන ලදී.

“පොලිසියේ නිර්ණායක වන්නේ ඉන්ද්‍රියයන්ට වටහා ගත හැකි තොරතුරු මත ක්‍රියා කිරීමයි. එය බීටා, ඇල්ෆා හෝ වෙනත් සංඥා භාෂාවක් නොව, සම්ප්‍රේෂණය කරන ලද නිවැරදි කරුණු" විය යුතු බව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර්

ජනරාල්වරයා පැවසීය. නිලන්ත ජයවර්ධන මහතාගේ අදහස් දැක්වීම මත සිසිර මෙන්ඩිස් මහතා නිවැරැදි තීරණයක් ගෙන ඇති බවද ඔහු පැවසීය. ඉන්පසුව ඔහු 2019 අප්‍රේල් 9 වැනි දින නිලන්ත ජයවර්ධන විසින් කරන ලද දිවුරුම් ප්‍රකාශය මෙහිදී සඳහන් කළ අතර, එහි ප්‍රහාරවල ප්‍රධාන පුද්ගලයන් වූ සහරාන්, ෂාහිඩ්, මිල්හාන් සහ රිල්වාන් යන පුද්ගලයින් සිව්දෙනා ගැන ඔහු සඳහන් කර ඇත.

පොලිස්පතිවරයා ගත් ක්‍රියාමාර්ග කවරේදැයි විනිසුරුවරයා විමසූ විට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා එම ලේඛනයේ 126 වැනි පිටුවේ R4A ලෙස සලකුණු කර ඇති ලේඛනය සඳහන් කළේය. මෙම ලේඛනයේ පොලිස්පතිවරයා විසින් පහත ලබන්නන් වෙත කරන ලද ලිපි හුවමාරු හතරක් අඩංගු වේ: ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස් පරීක්ෂක (එස්ඩීඅයිජී) (බස්නාහිර පළාත), ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස් පරීක්ෂක (අපරාධ හා විශේෂ කාර්ය බලකාය), ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස් පරීක්ෂක (විශේෂ ආරක්ෂක බලකාය) සහ මධ්‍යම විමර්ශන දෙපාර්තමේන්තුවේ (විශේෂ කාර්ය බලකාය) අධ්‍යක්ෂ. ලේඛනය සංයුක්ත ලේඛනයක් බැවින්, ලේඛනයේ දක්වා ඇත්තේ සාරාංශ වගුවක් පමණක් බව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා තර්ක කළේය. ඔහු තම රාජකාරිය අතපසු නොකළ බවට තර්ක කළ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා එම තොරතුරු පිළිබඳව ප්‍රභූවරුන් දැනුවත් කිරීමට කටයුතු කරමින් ලිපියට පිළිතුරු දුන්නේ ප්‍රියාල් දසනායක පමණි. මේ අනුව සිසිර මෙන්ඩිස් මහතා ලබාදුන් තොරතුරු සත්‍ය වශයෙන්ම ක්‍රියාත්මක කළ හැකි බව සනාථ වන බවද ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා සඳහන් කළේය.

එවිට විනිසුරුවරයා පොලිස්පතිවරයාට මීට වඩා කුමක් කළ හැකි දැයි විමසූ අතර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා පිළිතුරු දෙමින් සිද්ධිය අත්‍යාසන්න භාවය අනුව ඔහු කළ දේ ප්‍රමාණවත් නොවන බවත් පැහැදිලිවම ලිපි කිහිපයක් යැවීම තුළින් අදාළ ප්‍රශ්නය විසඳිය නොහැකි බවත්ය. එසේම නිලන්ත ජයවර්ධනගේ දිගුකාලීන ක්‍රියාවන් වන සංකල්ප සටහන් තැබීම සහ අවශ්‍ය නිලධාරීන්ට ඔහුගේ ආසන්න ප්‍රතිචාර ඉහළ නිලධාරීන්ගෙන් ඉල්ලා සිටි බව සනාථ විය. නිලන්ත ජයවර්ධන එතැනින් නතර වූයේ නැත. අනතුරුව ඔහු 2019 අප්‍රේල් මස 16 වැනි දින කාත්තන්කුඩි ප්‍රදේශයේදී යතුරුපැදියක් පිපිරී යාමේ සිද්ධිය සම්බන්ධයෙන් ඔහු පසු විපරමක් සිදු කළේය. නිලන්ත ජයවර්ධන එය ප්‍රහාර සඳහා පෙර පුහුණුවක් සහ පෙරහුරුවක් විය හැකි බවට සැක කළ අතර සිද්ධිය නිසි ලෙස වාර්තා කළේය.

"සාමාන්‍ය තත්ත්වයන් යටතේ මෙම නිලධාරීන්ට ලිපි ලබා දෙන්නේ කෙසේද?" යනුවෙන් විනිසුරුවරයා ප්‍රශ්න කළේය. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා කියා සිටියේ ඒවා අතින් භාරදී ඇති නමුත් මෙම කරුණ සනාථ කිරීමට කිසිදු සාක්ෂියක් නොමැති බවයි. අනතුරුව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා 2019 අප්‍රේල් 04 වැනිදා සිට තමන් විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග අනුපිළිවෙල පැහැදිලි කරන නිලන්ත ජයවර්ධනගේ දිවුරුම් ප්‍රකාශය ඇතුළත් R13 ලෙස සටහන් කර තිබූ ලියවිල්ලක් මගින් විනිසුරුවරුන් හමුවට ගෙන ගියේය. එයට සම්බන්ධ වූවන් අත්අඩංගුවට ගන්නා ලෙස ඉල්ලා ලිපියක් යොමු කළේය. 'යතුරුපැදි සිද්ධිය' පොලිස්පතිවරයා විසින් පිළිගෙන ඇති බව ඔහුගේ දිවුරුම් ප්‍රකාශයේ දැක්වේ. මේ බව සඳහන් කරමින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා විනිසුරුවරුන්ට කියා සිටියේ මෙම සියලු කරුණු නිලන්ත ජයවර්ධන ප්‍රහාරය වැලැක්වීමට කළ ක්‍රියාවන් සනාථ කිරීමට අවශ්‍ය පරිවේශනීය සාක්ෂි බවයි.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා තර්ක කළේ පොලිස්පතිවරයා තමාට යටත් නිලධාරීගෙන් ලැබුණු ලිපි ලේඛනවලට (වැරදි) අනුක්‍රමික අංක යෙදීම සහ ඒවා ලේඛනවල පමණක් තබා ගැනීම (ඒ අනුව ක්‍රියා නොකිරීම) ඔහුගේ වගකීම් පැහැර හැරීමක් වන අතර ඒ තුළින් රාජ්‍යය ගොදුරක් වීමට ඉඩ හැරීමක් බවයි. එවිට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා එය 'ඉවත්කිරීමේ මූලධර්මය' ලෙස සඳහන් කළ අතර එවැනි නීතිමය මූලධර්මයක් තිබේදැයි විනිසුරුවරයා විමසා සිටියේය. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා රාජකාරි ඉවත් කිරීමට යෝජනා කිරීම රූපක යෙදුමක් බව ද ප්‍රකාශ කළ අතර, එම ලිපිවල අනුක්‍රමික අංක වැරදි ලෙස සඳහන් කිරීමෙන් එහි අන්තර්ගතයේ බර පොලිස්පතිවරයා තේරුම් ගෙන නොමැති බව ද ප්‍රකාශ කළේය.

ප්‍රහාරය හා සම්බන්ධ අදාළ නම්, විදේශ ගමන් බලපත්‍ර අංක, ලිපිනයන්, දුරකතන අංක යනාදිය සහිතව නිලන්ත ජයවර්ධන විසින් ඉහළ නිලධාරීන් දැනුවත් කර ඇති බව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා අධිකරණයට ප්‍රකාශ කළේය. එම ලේඛනයේ 42 පිටුවේ ආගමික අන්තවාදයට අනුග්‍රහය දැක්වූ පුද්ගලයින් 42 දෙනෙකුගේ ලැයිස්තුවක් නිලන්ත ජයවර්ධන විසින් ලබා දී ඇත. තවත් අවස්ථාවක, 2019 ජනවාරි 31 වන දින, ජාතික තව්හිද් ජමාත් සහ ජමාත්-ඊ-ඉස්ලාමි යන සංවිධාන දෙකෙහිම සාමාජිකයන් වූ අල්කයිඩා වැනි ආගමික අන්තවාදයට දායක වූ පුද්ගලයින්ගේ නම් 129 ක් සහ වෙනත් තොරතුරු ඇතුළත් ලිපියක් 2019 ජනවාරි 31 වන දින නියෝජ්‍ය පොලිස්පති සෙනෙවිරත්න වෙත යවා ඇත. සමස්තයක් වශයෙන්, වාර්තා 97 ක් පොලිස්පතිවරයාට සහ වාර්තා 11 ක් ආරක්ෂක ලේකම් (SoD) වෙත ද භාර දී ඇත. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා ප්‍රකාශ කළේ ඒවා අහඹු සිදුවීම් හෝ හුදකලා වාර්තා නොව ලේඛන මාලාවක් බවයි.

අනතුරුව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා විසින් නිලන්ත ජයවර්ධන විසින් 2019 අප්‍රේල් 20 වන දින ආරක්ෂක ලේකම්ට (SoD) පොලිස්පතිවරයාට සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා (SDIG-CID) වෙත යවන ලද WhatsApp තිරපිටපත් පිළිබඳ සඳහන් කළේය. පොලිස්පතිවරයාට සවස 4.43 ට පමණ පණිවිඩයක් යවා ඇත. 2019 අප්‍රේල් 18 දිනැති ආරක්ෂක ලේකම්ගේ (SoD) දිවුරුම් ප්‍රකාශය මගින් මෙය තවදුරටත් සනාථ කර/තහවුරු කරන ලදී. එම පණිවිඩයම සවස 6.02 ට පමණ ආරක්ෂක ලේකම් (SoD) වෙත යවන ලදී. පොලිස්පතිවරයා ''Well received' යැයි පිළිතුරු දුන් අතර, ආසන්න ප්‍රහාරයක් ගැන තොරතුරු ලැබුණු විට තාර්කික ප්‍රතිචාරයක් ලෙස අපේක්ෂා කළ හැකිරීම මෙයදැයි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා (SASG) ගරු අධිකරණයෙන් විමසීය. නිලන්ත ජයවර්ධන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා (SDIG) ටත් පණිවිඩයක් යවා ඇත. . 2019 අප්‍රේල් 20 වැනි දින ප.ව. 5 ට පමණ ආරක්ෂක ලේකම්වරයාට (SoD) ඔහු ඇමතුමක් ලබා ගෙන ඒ බව විමසා ඇත. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා (SASG) විනිසුරුවරුන් ඉදිරියේ ප්‍රකාශ කළේ ආරක්ෂක ලේකම්වරයා (SoD) විසින් පරස්පර විරෝධී ස්ථාවරයන් සමඟ දිවුරුම් ප්‍රකාශ තුනක් ලබා දී ඇති බව සඳහන් කළේය. එක් දිවුරුම් ප්‍රකාශයක, ආරක්ෂක ලේකම්වරයා (SoD) කියා සිටියේ තමාට එවැනි පණිවිඩයක් නොලැබුණු බවයි.

එවිට විනිසුරුවරයා ප්‍රශ්න කළේ දැනුවත් නොකිරීම සම්බන්ධයෙන්, ආරක්ෂක ලේකම්වරයාගේ (SoD) ප්‍රකාශය මූලික තොරතුරු හෝ සිදුවීම් වර්ධනයට අදාළ යොමු කිරීමක් ද යන්නයි. සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා ආරක්ෂක ලේකම්වරයාගේ (SoD) වෙත කරන ලද සියලුම ලිපි හුවමාරුව උපුටා දැක්වීමෙන් පසු "WhatsApp පණිවිඩයකට වඩා හොඳ දැනුම්දීමක් කෙනෙකුට ලබා ගත හැකිද" යැයි පිළිතුරු දුන්නේය. "Well received" සහ "DIG සමඟ කාරණය සාකච්ඡා කළා" (අප්‍රේල් 21 ප්‍රහාරය සම්බන්ධයෙන් ආරක්ෂක ලේකම්වරයාගේ (SoD) දිවුරුම් ප්‍රකාශයට අනුව) අදාළ සාධාරණ ක්‍රියාමාර්ගය ප්‍රමාණවත් නොවන බව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා පැවසීය. තවද, ප්‍රියලාල් දසනායක විසින් සියලුම ප්‍රභූවරුන් දැනුවත් කිරීමේ/අනතුරු ඇඟවීමේ ක්‍රියාවෙන් විශාල ප්‍රජාවක් ආරක්ෂා නොවූ බව ඔහු සඳහන් කළේය. කටුවාපිටිය දේවස්ථානයේ බෝම්බකරු බර බෑගයක් රැගෙන යන අයුරු දුටු සිද්ධිය ගැන සඳහන් කරමින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා පැවසුවේ "බෑග් චෙක් කරන්නෙකු වැනි සරලම මිනුම යොදාගන්න තිබුණා" යනුවෙනි.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් නිලන්ත ජයවර්ධන මහතා එහි ක්‍රියාකිරීම සඳහා සමානයන් අතර ප්‍රමුඛයා (primus inter pares) බවට පත් වූ බව ප්‍රකාශ කළේය. මෙම තොරතුරු බොහෝ මූලාශ්‍ර ඔස්සේ සම්ප්‍රේෂණය කළ හැකි නමුත් අනෙක් අයටද එම තොරතුරු සපයා ගත හැකි තැනට ඔවුන් එක්රැස් කළේ නිලන්ත ජයවර්ධන බව ඔහු ප්‍රකාශ කළේය.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා විසින් අප්‍රේල් මස 24 වැනි දින ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයේ (TID) අධ්‍යක්ෂවරයා වෙත යොමු කරන ලද ලේඛනය පිළිබඳව සඳහන් කළේ ප්‍රහාරයෙන් පසු ගනු ලැබූ ක්‍රියාමාර්ග මොනවාදැයි විනිසුරුවරයා ඇසූ ප්‍රශ්නයෙන් අනතුරුවය.ත්‍රස්ත විමර්ශන කොට්ඨාසය (TID) විසින් පොලිස්පතිවරයාට වරදක් කර ඇති බව සොයාගත් බව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන ගත් ක්‍රිරියාමාර්ග හා සසඳන විට ආරක්ෂක ලේකම්වරයා සහ පොලිස්පතිවරයා යන දෙදෙනාම නිසි ක්‍රිරියාමාර්ග නොගත් බව ද ඔහු සඳහන් කළේය. නඩුව එදිනම පස්වරු 1.00 ට කල් තැබිණි.[91]

2022 ඔක්තෝම්බර් මස 05 වන දින දෙපාර්ශවයටම සති තුනක් ඇතුළත පෙත්සම් සම්බන්ධයෙන් සිය ලිඛිත දේශන ඉදිරිපත් කරන ලෙස නියෝග කරන ලදී. බෝම්බ ප්‍රහාරයෙන් තම දරුවන් දෙදෙනා අහිමි වූ පියෙකු වන නන්දන සිරිමාන්න, ව්‍යාපාරික ජනත් විදානගේ, සරත් ඉද්දමල්ගොඩ ඇතුළු කතෝලික පූජකවරුන් තිදෙනෙකු සහ ෂැංග්‍රිලා බෝම්බ ප්‍රහාරයෙන් විපතට පත් නීතිඥ මෝදිත ඒකනායක ඇතුළු පිරිසක් විසින් මෙම පෙත්සම් ගොනු කර තිබුණි. හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර, හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු, හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන, හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ, එවකට කැබිනට් මණ්ඩලය සහ නීතිපතිවරයා පෙත්සම්වල වගඋත්තරකරුවන් ලෙස නම් කර ඇත. මුස්ලිම් අන්තවාදීන් පිරිසක් විසින් ත්‍රස්ත ප්‍රහාරයක් ක්‍රියාත්මක කරන බවට බුද්ධි තොරතුරු ලැබී තිබියදීත් පාස්කු ප්‍රහාරය වැළැක්වීමට වගඋත්තරකරුවන් ක්‍රියා නොකළ බව පෙත්සම්වලින් චෝදනා කර තිබේ. එබැවින් ඔවුන්ගේ නොසැලකිල්ල සම්බන්ධයෙන් ඔවුන්ට එරෙහිව නීතිමය පියවර ගන්නා ලෙස නියෝගයක් නිකුත් කරන ලෙස අදාළ පෙත්සම් මගින් ඉල්ලා ඇත.[92]

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්වරයා නීතිපති දෙපාර්තමේන්තුව වෙනුවෙන් පෙනී සිටි අතර නීති විරෝධී නොකර හැරීම් සහ රාජ්‍ය වගකීම් මත ඔහුගේ කරුණු කරුණු පදනම් විය. පොලිස්පතිවරයා විසින් ත්‍රිපුද්ගල කමිටුව වෙත යවන ලද ලිපිය පිළිබඳ ඔහු සඳහන් කළේය. ත්‍රිපුද්ගල කමිටුව පිළිබඳ නිවැරදි කිරීම එම ලේඛනයේ සිදු කර ඇති අතර එහිදී මුලින් එය 'පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව' ලෙස සඳහන් කර ඇති බවද ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්වරයා සඳහන් කළේය. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්වරයා විනිසුරු අලුවිහාරේ ගේ ප්‍රශ්නය ගැන සඳහන් කළ අතර එය පෙර දින මතු කරන ලදී. ප්‍රියලාල් දසනායකගේ ලිපියට අමතරව තවත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් (SDIG) පොලිස්පතිවරයාට ලිපි යැව්වාද යන්න ප්‍රශ්නය ගතවිය. මෙම ප්‍රශ්නයට අදාළව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්වරයා විසින් ත්‍රිපුද්ගල කමිටුව වෙත යවන ලද ලේඛනයේ සඳහන් කර ඇති අතර, එහි 2019 අප්‍රේල් මස 10 වන දින ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නන්දන මුණසිංහ සහ 2019 අප්‍රේල් 11 දිනැති ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වික්‍රමසිංහ විසින් පොලිස්පතිවරයා වෙත යවන ලද ලිපි අමුණා ඇත. [93]

පසුව, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්වරයා විසින් නීති විරෝධී නොකර හැරීම්වල නීතිමය බලපෑම්වලට අදාළ කරුණු ඉදිරිපත් කරන ලදී. ඒ සඳහා, ඔහු ආතර් ලෙවන්ස් විසින් ලියන ලද ‘A Causation Approach to Criminal Omissions’ යන මාතෘකාව යටතේ California Law Review වෙත යොමු වූ අතර එහි 571, 572, 573, 574, 575 සහ 576 පිටුවලින් සපයගන්නා ලද උපුටා ගැනීම් සඳහන් කර සිටියේය.

අපරාධ නඩු විධාන සංග්‍රහයේ 107 වගන්තිය සඳහන් කරමින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්වරයා තර්ක කළේ අපරාධය වැළැක්වීමට සඳහා 'මැදිහත්' වී ක්‍රියා කිරීමට පොලිසියට වගකීමක් ඇති බවයි. එවිට විනිසුරු නවාස් මූලික අයිතිවාසිකම් (FR) පෙත්සම්වලට අපරාධ නීති මූලධර්ම ඇතුළත් කළ යුතුද යන්න පිළිබඳ ප්‍රශ්නයක් ඉදිරිපත්

කළේය. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්වරයා ප්‍රකාශ කළේ ක්‍රියාවන් සාපරාධී වගකීම් ආකර්ෂණය කරන බවයි, එබැවින් මෙම ප්‍රමිතීන් මූලික අයිතිවාසිකම් (FR) පෙත්සම් වලදී භාවිතා කළ යුතුය. ඉනික්බිතිව විනිසුරුවරයා විසින් ඒ සඳහා පූර්වාදර්ශ පවතීදැයි විමසා සිටින ලදී. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්වරයා පිළිතුරු දෙමින් කියා සිටියේ රාජකාරි පැහැර හැරීම මූලික අයිතිවාසිකම් (FR) පෙත්සම්වල සලකා බැලූ බවයි. හේමසිරි ප්‍රනාන්දු මහතා සහ පූජිත් ජයසුන්දර මහතා සම්බන්ධයෙන් තමන් ඉදිරිපත් කළ වරදේ බරපතළකම සෙසු වගඋත්තරකරුවන්ටද ලබාදෙන ලෙස විනිසුරුවරයා ඉල්ලා සිටියේය. එයට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්වරයා පිළිතුරු දෙමින් කියා සිටියේ 'වැඩිබර සාක්ෂි' යන මූලධර්මය යෙදිය යුතු බවයි. [94]

තවද, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්වරයා විසින් පුද්ගලයන් විසින් සිදුකරන ලද දෝෂයක් රජය එතුළින් විපතට පත්ව ඇති අවස්ථාවක එම රාජ්‍ය මතම වරද පැටවිය හැකිද යන ප්‍රශ්නයක් ඉදිරිපත් කළේය. එසේම, අදාළ රාජ්‍යය වැරදිකරුවෙකු ලෙස පෙනී ගියහොත්, එය දේශීය ක්ෂේත්‍රයේ පමණක් නොව ජාත්‍යන්තර තලයේ පවා එම අදාළ රාජ්‍ය නෙරපා හැරීමට හා අපකීර්තියට පත්වනු ඇතැයි කනස්සල්ල මතු කළේය. මේ කාරණය සම්බන්ධයෙන් රාජ්‍යය සංවේදී වී ඇති බව සනාථ කරමින්, ප්‍රහාරයෙන් දිනකට පසු අප්‍රේල් 22 වැනි දින කැබිනට් මණ්ඩලයේදී විනාඩියක නිශ්ශබ්දතාවයක් ප්‍රකාශයට පත්කර එය සිහිපත් කළ බව සඳහන් වූ උදය රන්ජන් සෙනවිරත්නගේ දිවුරුම් ප්‍රකාශය ගැන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්වරයා සඳහන් කළේය. [95]

අනතුරුව ඔහු සිය කරුණු දැක්වීම සංක්ෂිප්ත කරමින් කියා සිටියේ නිලන්ත ජයවර්ධන මහතා තොරතුරු සපයන්නන් විසින් සකස් කර තොරතුරු සපයා ගනිමින් තම රාජකාරිය ඉටු කළ බවයි. ප්‍රියලාල් දසනායක මහතාද තමන්ට පැවරුණු රාජකාරිය ඉටුකර ඇති බවද ඔහු සඳහන් කළේය. අවසාන වශයෙන් ඔහු සඳහන් කළේ මෙම සංහාරය හේතුවෙන් තමන් දුකට පත් වූ අයෙක් බවත් එම නිසා රටේ රටේ ශෝකයෙන් පෙළෙන සියලු දෙනා වෙනුවෙන් තමන් පෙනී සිටින බවත්ය.

අනතුරුව හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා වෙනුවෙන් ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාෆා මහතා පෙනී සිටියේය. ජනාධිපතිවරයා මහජන ඡන්දයෙන් තේරී පත් වූ අයෙකු බැවින් ඔහුට නියෝග දාමය අදාළ නොවන බවද ඔහු පැවසීය. එහිදී විනිසුරුවරයා ඉල්ලා සිටියේ සවිස්තරාත්මක ලිඛිත දේශනයක් ගොනු කරන ලෙසයි. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති 46 වන වගඋත්තරකාර රවින්ද්‍ර සම්බන්ධයෙන් ප්‍රකාශ කර ඇත්තේ ප්‍රහාරය අතරතුර ඔහු රටින් බැහැරව සිටි බවයි. ඔහු ජාත්‍යන්තර පොලිසිය සමග පැවති සම්මන්ත්‍රණයකට සහභාගී විය. එමෙන්ම බුද්ධිමය දේපළ සම්බන්ධ කරුණු සම්බන්ධයෙන් කටයුතු කරන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වන අතර මාවනැල්ල බුදු පිළිමවලට හානි කිරීමේ සිද්ධිය සම්බන්ධයෙන් සහරාන් සම්බන්ධයෙන් මුලින්ම තොරතුරු හෙළි කළේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව බව ද මෙහිදී වැඩිදුරටත් සඳහන් විය. අප්‍රේල් 9 වැනිදා එවා ඇති ලිපිය සඳහන් කරමින් රජයේ නීතිඥවරයා කියා සිටියේ එය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට මිස ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිට (SDIG) ට නොවන බවයි. [96]

47 වැනි වගඋත්තරකරු සම්බන්ධයෙන් පොලිස් විශේෂ කාර්ය බළකායේ සංවිධානාත්මක අපරාධ සහ මත්ද්‍රව්‍ය වැටලීම් අණදෙන නිලධාරී ලතීෆ් මහතා අප්‍රේල් 01 වැනිදා සිට 8 වැනිදා දක්වා රටින් බැහැරව සිට ප්‍රංශයට ගොස් ඇත, එසේම අප්‍රේල් 17 සිට 20 දක්වා ඔහු වෙනත් රාජකාරියකට අනුයුක්තව සිට ඇත. එසේම ලතීෆ් මහතාගේ දිවුරුම් ප්‍රකාශයට අනුව නිලන්ත ජයවර්ධනගෙන් ප්‍රහාරයට අදාළ වට්ස්ඇප් පණිවිඩය ඔහුට ලැබී නැති බව සඳහන් වේ. ප්‍රහාර එල්ල වූ වහාම විශේෂ කාර්ය බලකාය විසින් ලබා දුන් උපදෙස් අනුව වහාම ප්‍රහාරකයන්ගේ වාසස්ථාන සොයා ගන්නා ලදී. විශේෂ කාර්ය බළකාය ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයට ආරක්ෂාව ලබාදුන් අතර මහ කොමසාරිස් කාර්යාලයට

ප්‍රහාරයක් එල්ල නොවූයේ විශේෂ කාර්ය බළකායේ ආරක්‍ෂාව නිසා බව මෙතෙක් තහවුරු වී නොමැත. 53 වන වගඋත්තරකරු වන මධ්‍යම සහ ඌව පළාත් ජ්‍යෙෂ්ඨ පොලිස්පති වික්‍රමසිංහ මහතා සම්බන්ධයෙන් අප්‍රේල් මස 04 වනදා සිට 09 වනදා දක්වා කාලය තුළ කිසිදු තොරතුරක් නොලැබුණේදැයි විනිසුරුවරයා විමසා සිටියේ ය. රජය ඊට සෘණාත්මකව පිළිතුරු ලබා දුන්නේය. [97]

## 5 වන කොටස: හෙජාස් හිස්බුල්ලා සහ තවත් අයට එරෙහි නඩුව HC 78/2021

පෙත්සම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද ඉහත සියලු පෙත්සම් වලට අදාළව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 2023 ජනවාරි මස 12 වන දින මෙම තීන්දුව ප්‍රකාශයට පත් කරන ලදී. මූලික අයිතිවාසිකම් පෙත්සම්වල නම් කර ඇති වගඋත්තරකරුවන් පාස්කු ඉරිදා ප්‍රහාරය වැළැක්වීමට අපොහොසත් වූ බවත්, ආසන්න ප්‍රහාරයක් පිළිබඳ විශ්වසනීය තොරතුරු තිබියදීත්, එමගින් පෙත්සම්කරුවන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවත් ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කළේය. හිටපු ජනාධිපති **මෛත්‍රීපාල සිරිසේන** මහතාට **රුපියල් මිලියන 100 ක** වන්දියක් ගෙවන ලෙසත්, හිටපු පොලිස් ප්‍රධානී **පූජිත් ජයසුන්දර** සහ හිටපු රාජ්‍ය බුද්ධි අංශ ප්‍රධානී **නිලන්ත ජයවර්ධන** යන මහත්වරුන්ට **රුපියල් මිලියන 75** බැගින් වන්දි ගෙවන ලෙසත්, හිටපු ආරක්ෂක ලේකම් **හේමසිරි ප්‍රනාන්දු** මහතාට **රුපියල් මිලියන 50 ක** වන්දියක් ගෙවන ලෙසත් අධිකරණය නියෝග කළේය. ජාතික බුද්ධි සේවයේ හිටපු ප්‍රධානී **සිසිර මෙන්ඩිස්ට රුපියල් මිලියන 10ක** වන්දියක් ගෙවන ලෙස අධිකරණය නියෝග කළේය. විපතට පත් වූවන්ට වන්දි වශයෙන් **රුපියල් මිලියනයක** බැගින් වූ මුදලක් ගෙවන ලෙස අධිකරණය **රජයට** නියෝග කළේය. මෙම සියලු අරමුදල් එකතු කර 2019 පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරයෙන් විපතට පත් වූවන්ට වන්දි ගෙවීම සඳහා යෙදවිය යුතු බව ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කළේය. විපතට පත් වූවන්ට වන්දි ගෙවීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග රජය විසින් ගත යුතු බවත් අධිකරණය නියෝග කළේය. මීට අමතරව **හිටපු රාජ්‍ය බුද්ධි අංශ ප්‍රධානී නිලන්ත ජයවර්ධනට එරෙහිව මාස 06ක් ඇතුළත විනය ක්‍රියාමාර්ග ගන්නා ලෙසද ශ්‍රේෂ්ඨාධිකරණය නියෝග කළේය.** වින්දිතයන්ට වන්දි ලබා දීමේ ප්‍රගතිය සහ හිටපු රාජ්‍ය බුද්ධි සේවා ප්‍රධානී නිලන්ත ජයවර්ධනට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව අධීක්ෂණය කර අධිකරණයට වාර්තා කරන ලෙස නීතිපතිවරයාට නියෝග කෙරිණි. මෙම තීන්දුවට අනුකූල වීම සඳහා රජය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග [reparations.gov.lk](reparations.gov.lk) සොයාගත හැකිය.

පාස්කු ප්‍රහාරයේ බෝම්බ ප්‍රහාරකයකු සමඟ සබඳතා පැවැත්වූ සේව් ද පර්ල්ස් පුණ්‍යායතනයට සම්බන්ධ බවට චෝදනා කරමින් නීතිඥ හෙජාස් හිස්බුල්ලාට එරෙහිව මෙම නඩුව පවරා ඇත.

සාමාන්‍යයෙන් මෙම නඩුවට නීතිපති දෙපාර්තමේන්තුව වෙනුවෙන් පෙනී සිටින නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් ලක්මිණි ගිරිහාගම මහත්මිය සහ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් සුදර්ශන ද සිල්වා මහතා 2022 ඔක්තෝබර් මස 04 වැනිදා පෙනී සිටියේ නැත. ඒ අනුව නීතිපති දෙපාර්තමේන්තුව වෙනුවෙන් පෙනී සිටි රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය වෙනත් දිනයක් ඉල්ලා අධිකරණයට කරුණු ඉදිරිපත් කළාය. ඒ අනුව මෙම නඩුව 2022 නොවැම්බර් මස 25 වැනි දින වැඩිදුර විභාගයට ගැනීමට නියමිතව තිබුණි. එපමණක් නොව මෙම සිද්ධිය සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශනවලදී පැමිණිල්ලේ අංක 1 සහ 2 දරන සාක්ෂිකරුවන් විසින් කොටුව මහේස්ත්‍රාත් කාර්යාලයේදී සිදු කරන ලද රහසිගත ප්‍රකාශ මාධ්‍ය වෙත අනාවරණය වී ඇත. ඒ අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබාදුන් ප්‍රකාශ ඇතුළත් පළමු තොරතුරු ඉදිරිපත් කළ යුතු බවට අධිකරණය නියෝගයක් නිකුත් කළේය. [98]

2023 ජනවාරි මස 23 වන දින 2 වන විත්තිකරු වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු වන මොහොමඩ් නසාර් මොහොමඩ් මලික්ගෙන් තවදුරටත් හරස් ප්‍රශ්න විමසීම සිදු කරන ලදී. නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් සුදර්ෂණ ද සිල්වා මහතා මහතා ද ඔහුගෙන් නැවත ප්‍රශ්න විමසන ලදී. මීට අමතරව, විනිසුරුවරයා විසින් පැමිණිල්ලේ අංක 2, අංක 46, අංක 51 සහ අංක 52 දරන සාක්ෂිකරුවන්ට සිතාසි නිකුත් කරන ලදී. [99]

පැමිණිල්ලේ සාක්ෂිකරු අංක 2, 19 හැවිරිදි පිරිමි ළමයා, 2023 මාර්තු මස 24 වන දින ඔහුගේ සාක්ෂි ප්‍රධාන වශයෙන් අවසන් කළේය. මීට අමතරව, එදින සාක්ෂිකරු අධිකරණයට දන්වා සිටියේ ඔහු රාමසාන් මාසය වෙනුවෙන් උපවාසයේ යෙදී සිටින බවත්, ඔහු යම් අපහසුතාවක් පවතින බවත්ය, හරස් ප්‍රශ්න විමසීම මාර්තු 27 වැනිදාට කල් තැබිණි. පැමිණිල්ලේ සාක්ෂි අංක 46 ට අදාළ තොරතුරු සංශෝධනය කරන ලද අතර ඊළඟ දිනට ඔහු අධිකරණය හමුවේ පෙනී සිටිය යුතු බවට සඳහන් විය.[100] 2023 මාර්තු 27 වැනි දින 1 වැනි විත්තිකරුගේ නීතිඥවරයා විසින් 2 වැනි සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න විමසීම සිදු විය. [101]

2023 මැයි මස 12 වන දින 2 වන සාක්ෂිකරු අධිකරණයේ නොපැමිණි අතර ඔහු අධිකරණය ඉදිරියේ පෙනී සිටියේ ද නැත. 2 වන විත්තිකරු රෝහල් ගත කර ඇති බැවින් ඔහු ද පැමිණ සිටියේ නැත. අධිකරණ කටයුතු තවදුරටත් සිදුකර ගෙන යාමට නොහැකි බැවින් වැඩිදුර නඩු විභාගය සඳහා ජූලි මස 14 වන දිනට දින නියම කරන ලදී.[102]

## 6 වන කොටස: මවුලවිවරුන් තිදෙනෙකුට එරෙහි නඩුව - HC 188/2021

පුත්තලම ප්‍රදේශයේ මද්රසා පාසලක අන්තවාදය ප්‍රචාරය කළ බව කියන සිද්ධියක් සම්බන්ධයෙන් මෙම නඩුව පවරා ඇත.

2022 නොවැම්බර් 25 වැනි දින විත්තිකරු වෙනුවෙන් පෙනී සිටින ජනාධිපති නීතිඥ මෛත්‍රී ගුණරත්න මහතා වෙනත් අධිකරණයක් හමුවේ පෙනී සිටින බැවින් ඔහුට එදින අධිකරණය ඉදිරියේ පෙනී සිටීමට නොහැකි වූ බැවින් විත්තිකරු වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරු අධිකරණයෙන් වෙනත් දිනයක් ඉල්ලා සිටියහ. පැමිණිල්ලේ සාක්ෂි අංක 13 සහ 14 යන අය පැමිණ සිටියහ. මෙම නඩුව 2023 මාර්තු 17 වන දින පූර්ව නඩු විභාගයක් සඳහා නැවත කැඳවීමට නියම කරන ලදී. [103]

2023 ජුනි මස 05 වන දින පැමිණිල්ලේ අංක 13 සහ 14 දරන සාක්ෂිකරුවන්ට **2023 ජූලි මස 10** වන දිනට පෙනී සිටින ලෙස අධිකරණය නියෝග කළේය. [104]

## 7 වන කොටස: හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාට එරෙහි පෞද්ගලික පැමිණිල්ල - 23084/22

හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාට එරෙහිව 2022 සැප්තැම්බර් මස 16 වන දින මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කර තිබූ පෞද්ගලික පැමිණිල්ලක් සම්බන්ධයෙන් මෙම නඩුව පවරා ඇත. [105] සහරාන් හෂීම් සහ ඔහුගේ අනුගාමිකයන් අත්අඩංගුවට ගන්නා ලෙස ත්‍රිවිධ හමුදාවට සහ/හෝ පොලිසියට උපදෙස් දීමට අපොහොසත් වීම සහ/හෝ සෝදිසි කිරීම් කටයුතු සිදු කිරීමට අපොහොසත් වීම සහ/හෝ පාස්කු ප්‍රහාරයේදී සිදුවූ හානි සහ මරණ වළක්වා ගැනීමට අපොහොසත් වීම තුළ විත්තිකරු ආරක්ෂක අමාත්‍යාවරයා ලෙස සිය නීත්‍යානුකූල රාජකාරි වගකීම් ඉටු කිරීමට අපොහොසත් වී ඇති බවට පැමිණිලිකරු චෝදනා කර ඇත. එබැවින් විත්තිකරු දණ්ඩ නීති සංග්‍රහයේ 298 සහ 329 වගන්ති යටතේ නොසැලකිලිමත්කමින් මරණයක් සිදු සහ/හෝ ජීවිතය හෝ අන් තැනැත්තන්ගේ පුද්ගලික ආරක්ෂාව අන්තරාදායක වන ක්‍රියාවකින් බරපතල තුවාල සිදු කිරීම සම්බන්ධයෙන්

වරදකරු කිරීමට පැමිණිලිකරු විසින් මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුතු ආරම්භ කර ඇත. [106] මහේස්ත්‍රාත් අධිකරණය විසින් විත්තිකරුට 2022 සැප්තැම්බර් මස 16 වන දිනට සිතාසි නිකුත් කරන ලදී.

2022 ඔක්තෝම්බර් මස 14 වන දින මෙම නඩුව සමඟ අභියාචනාධිකරණයේ ගොනු කර ඇති රිට් 354/22 නඩුවේ අභියාචනාධිකරණ විනිසුරුවරුන් විසින් ලබා දුන් නියෝගය අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් කොටුව මහේස්ත්‍රාත් අධිකරණය වෙත යොමු කරන ලදී. අභියාචනාධිකරණය ලබාදුන් නියෝගය සලකා බැලූ කොටුව මහේස්ත්‍රාත්වරයා එදින කිසිදු නියෝගයක් ලබා නොදෙන බව පාර්ශවයන්ට දැනුම් දෙන ලදී. මෙම නඩුවේ විත්තිකරු වන හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ද කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට පැමිණ සිටියේය. ඒ අනුව මෙම නඩුව 2023 ජනවාරි මස 27 වැනි දින කැඳවීමට නියමිතව තිබුණි.[107]

2023 ජනවාරි 27 වන දින පැමිණිලිකරු වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥවරයා අධිකරණයට දන්වා සිටියේ විත්තිකරු විත්ති කූඩුවට නොපැමිණෙන බවයි.[108] අනතුරුව නීතිඥවරුන් දෙදෙනාම මේ සම්බන්ධයෙන් වාචික කරුණු ඉදිරිපත් කළ අතර විනිසුරුවරයා තීරණය කළේ සිතාසි නිකුත් කිරීමෙන් පසු එම පුද්ගලයා විත්තිකරුවෙකු බවට පත්වන බවත්, විත්ති කූඩුවට පැමිණිය යුතු බවත්ය. අභියාචනාධිකරණය අතර පවතින නඩුව අවසන් නොවීම හේතුවෙන් මෙම නඩුව මාර්තු මස 17 වැනිදාට කල් තැබිණි.[109] 2023 මාර්තු මස 17 වැනි දින රිට් නඩුවේ නියෝගය ලැබෙන තෙක් නඩු කටයුතු අත්හිටුවීමට අධිකරණය තීරණය කළේය.[110]

## 8 වන කොටස: හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් අභියාචනාධිකරණයේ ගොනු කරන ලද රිට් නඩුව - WRIT 354/22

මෙම නඩුව 2022 ඔක්තෝම්බර් මස 14 වන දින කොටුව මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ පෙනී සිටින ලෙස ඉල්ලා හිටපු ජනාධිපතිවරයාට සිතාසි නිකුත් කරමින් අංක 23084/22 දරන නඩුවෙහි මහේස්ත්‍රාත් අධිකරණය විසින් ලබා දුන් නියෝගය නීතිවිරෝධී, බල රහිත සහ නීතියට බල නොපාන බවට චෝදනා කරමින් හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් 2022 සැප්තැම්බර් මස 29 වන දින අභියාචනාධිකරණයට ගොනු කරන ලද පෙත්සමක් සම්බන්ධයෙනි. පෙත්සම්කරුට සිතාසි නිකුත් කරමින් 2022 සැප්තැම්බර් 16 වැනි දින නිකුත් කර ඇති එම නියෝගය ක්‍රියාත්මක කිරීම වළක්වාලමින් සර්ටියෝරාරි ආඥාවක්, තහනම් ආඥාවක් සහ අතුරු නියෝගයක් නිකුත් කරන ලෙස පෙත්සම්කරු අභියාචනාධිකරණයෙන් ඉල්ලා ඇත. කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 23084/22 දරන එම නඩුවේ ඉදිරි කටයුතු අත්හිටුවීමේ අතුරු නියෝගයක් නිකුත් කරන ලෙස ද පෙත්සම්කරු අධිකරණයෙන් ඉල්ලා තිබුණි.

2022 ඔක්තෝම්බර් 11 වැනි දින, සමාජය සහ සාමයික කේන්ද්‍රය මෙම නඩුවට මැදිහත් පාර්ශවයක් ලෙස පෙනී සිටීමට නීතිඥවරුන් මාර්ගයෙන් අධිකරණයෙන් අවසර ඉල්ලා සිටියේය. ඊට කිසිදු පාර්ශ්වයක් විරෝධය නොදැක්වූ අතර අධිකරණය අවසර ලබා දුන්නේය. මෙදින පෙත්සම්කරු වෙනුවෙන් කරුණු ඉදිරිපත් කෙරිණි. [111] ප්‍රධාන කරුණු තුනක් ඔස්සේ පෙත්සම්කරු කරුණු ඉදිරිපත් කළේය. එහිදී පෙන්වා දුන්නේ පෙත්සම්කරුට එරෙහිව බැලූ බැල්මට නඩුවක් ගොනු කිරීමට අවශ්‍ය ඍජු පිළිගත හැකි සාක්ෂි නොමැති බව පෙන්වා දෙන ලදී. [112] එමෙන්ම පෙත්සම්කරුට සිතාසි නිකුත් කරන ලෙසට කොටුව මහේස්ත්‍රාත් අධිකරණය ලබාදුන් නියෝගයේ දණ්ඩ නීති සංග්‍රහයේ කුමන වගන්ති පෙත්සම්කරුට අදාළ වන්නේ දැයි නිශ්චිතව සඳහන් කර නොමැති බව ද මෙහිදී පෙන්වා දෙන ලදී. ජනක් ද සිල්වා ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ කරුණු මත පෙත්සම්කරුට එරෙහිව පියවර ගත නොහැකි බවද පෙත්සම්කරු වෙනුවෙන් ප්‍රකාශ කෙරුණි. පෙත්සම්කාර පාර්ශවය වෙනුවෙන් කරුණු ඉදිරිපත් කෙරුණේ තවමත් විමර්ශන

සිදුවෙමින් පවතින පසුබිමක පෙත්සම්කරු විත්තිකරුවෙකු ලෙස නම් කිරීම ද දෝෂ සහිත බව ය.[113] ඇතැම් නඩු තීන්දු උපුටා දක්වමින් පෙත්සම්කරු සිය තර්ක ඉදිරිපත් කළේය. විශේෂ ජනාධිපති විමර්ශන කොමිෂන් සභා නීතියට අනුව ජනාධිපතිවරයා "රාජ්‍ය නිලධාරියා" යන යෙදුමට යටත් නොවන බව ද මෙහිදී පෙන්වා දෙන ලදී. වගඋත්තරකරුවන් වෙනුවෙන් කරුණු ඉදිරිපත් කිරීම සඳහා මෙම නඩුව 2022 ඔක්තෝම්බර් මස 12 වන දින කැඳවීමට නියමිතව තිබුණි.[114]

2022 ඔක්තෝබර් 12 වැනි දින වගඋත්තරකරුවන් වෙනුවෙන් පෙනීසිටි නීතිඥයන් කරුණු දැක්වූ අතර, පෙත්සම්කරුවන් වෙනුවෙන් පෙනීසිටි නීතිඥයන් ද ස්වකීය නියෝජක පාර්ශ්වයන් වෙනුවෙන් කරුණු දක්වන ලදී.[115] තුන්වන සහ සිව්වන වගඋත්තරකරුවන් වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරු පෙන්වා දුන්නේ පෙත්සම්කරු මෙම ප්‍රහාරය පිළිබඳව දැනුවත් බවත් ඔහුගේ වගකීම 2016 නොවැම්බර් මාසය දක්වා විහිදෙන බවත්ය. එමෙන්ම අංක 23084/22 දරන මහේස්ත්‍රාත් අධිකරණ නඩුවේදී විනිසුරුවරයා සිය නියෝගය ලබාදුන්නේ ජනක් ද සිල්වා ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ නිර්දේශ මත පමණක් නොව විනිසුරුවරයාගේ සොයාගැනීම් මත ද විනිසුරුවරයා සිය නියෝගය ලබා දී ඇත [116]. ජනක් ද සිල්වා කොමිසම පෙත්සම්කරු විසින්ම පත් කරන ලද බවත්, සාක්ෂිකරුවන් කැඳවා සාක්ෂි ඉදිරිපත් කළ බවත්, මෙම නඩුවේදී පෙත්සම්කරුට එරෙහිව සාක්ෂි ද කැඳවූ බවත් සඳහන් විය.[117] එසේම, තුන්වන සහ සිව්වන වගඋත්තරකරුවන් වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරුන් වැඩිදුර කරුණු ඉදිරිපත් කළ අතර පෙත්සම්කරුගේ කීර්තිනාමය සහ යුක්තිය ඉටු කිරීම අතර පහසුවේ සමතුලිතතාවය පිළිබඳව ප්‍රශ්න මතු කරන ලදී. [118] පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් පෙත්සම්කරුට එරෙහිව පවරා ඇති මූලික අයිතිවාසිකම් නඩුවට අදාළව සත් පුද්ගල ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඬුල්ලක් විසින් තීන්දුවක් ලබා දීමට නියමිත බව අතිරේක සොලිසිටර් ජනරාල්වරයා අධිකරණයට දන්වා සිටියේය.[119] මැදිහත් පාර්ශවයක් ලෙස, මෙම නඩුවට සම්බන්ධ සමාජය සහ සාමයික කේන්ද්‍රය නියෝජනය කරන නීතිඥවරයා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන සඳහන් කරමින් රිට් පෙත්සමට එරෙහිව සිය කරුණු ඉදිරිපත් කර සිටියේය. ඉහත සඳහන් කළ මහේස්ත්‍රාත් අධිකරණ නඩුව අත්හිටුවීමට අතුරු නියෝගයක් ලබා දෙන්නේද නැද්ද යන්න පිළිබඳ තීරණය 2022 ඔක්තෝම්බර් මස 14 වන දින ලබා දීමට නියමිතව තිබුණි.[120]

2022 ඔක්තෝබර් 14 වන දින අභියාචනාධිකරණය විසින් නියෝගය නිකුත් කරන ලදී (අදාළ නියෝගයේ ඇතැම් කොටස් විනිසුරුවරයා විසින් කියවා දෙන ලදී). මෙම නියෝගයේ පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කර ඇති මූලික අයිතිවාසිකම් නඩු පිළිබඳවද සඳහන් කර තිබූ අතර.[121] එම නියෝගය නිකුත් කළ දින (14 වැනිදා) සිට සති 10ක් ඇතුළත පෙත්සම්කාර මෛත්‍රීපාල සිරිසේන මහතාට එරෙහිව අගතිගාමී නියෝග නිකුත් නොකරන ලෙස අභියාචනාධිකරණය කොටුව මහේස්ත්‍රාත්වරයාට නියෝග කළේය. [122] කොටුව මහේස්ත්‍රාත් අධිකරණය නිකුත් කළ සිතාසි බලරහිත කරන ලෙස සිරිසේන මහතා ඉල්ලා සිටි අතුරු තහනම් නියෝගය නිකුත් කර නැත. අධිකරණය හමුවේ නීතිමය තර්ක කිහිපයක් මතුවී ඇති අතර ඒවා විසඳා ගත යුතු විය. අභියාචනාධිකරණ විනිසුරුවරුන් විසින් 2022 නොවැම්බර් මස 30 වන දින හෝ ඊට පෙර මෙම නඩුවේ ලිඛිත දේශන ගොනු කරන ලෙස පාර්ශවයන්ට දැනුම් දෙන ලදී. අභියාචනාධිකරණය විසින් මෙම නියෝගය ලබා දෙන අවස්ථාවේ හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ද අධිකරණයේ පෙනී සිටියේය. මෙම නඩුව 2022 දෙසැම්බර් මස 06 වැනි දින කැඳවීමට නියමිතව තිබුණි. [123]

2022 දෙසැම්බර් මස 06 වන දින පෙත්සම්කාර පාර්ශවය වෙනුවෙන් පෙනී සිටි උගත් ජනාධිපති නීතිඥවරයා සහ වගඋත්තරකරු වෙනුවෙන් පෙනී සිටි උගත් ජනාධිපති නීතිඥවරයා ලිඛිත දේශන ගොනු කිරීම සඳහා තවදුරටත් කාලය ඉල්ලා සිටියහ. සියලු පාර්ශවයන් මෙම කාරණය තර්කය සඳහා නැවත සකස් කරන ලෙස යෝජනා කළහ.

2023 ජනවාරි මස 17 වන දින මහේස්ත්‍රාත්වරයාගේ අභිමතය පරිදි පෞද්ගලික පැමිණිල්ලකින් සිතාසි නිකුත් කිරීම සම්බන්ධයෙන් සියලු පාර්ශව විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.

2023 ජනවාරි මස 31 වන දින අභියාචනාධිකරණයේ සභාපති, අතිගරු විනිසුරුතුමා ඉදිරියේ අංක 301 දරන අධිකරණයේ මේ පිළිබඳව සඳහන් කරන ලෙස අධිකරණය නියෝග කළේය. තුන්වන වගඋත්තරකරු සිදුකළේ මෙම නඩුව ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ල වෙත යොමු කිරීම සඳහා වන ඉල්ලීමේ යෝජනාවට සහාය දැක්වීමයි. 2023 පෙබරවාරි මස 09 වන දින මෙම නඩුවට සහය දැක්වීම සඳහා වෙනත් දිනයක් ලබා දෙන ලදී.[124]

2023 පෙබරවාරි මස 24 වන දින 3 වන වගඋත්තරකරු වෙනුවෙන් මෙම නඩුව කැඳවනු ලැබුවේ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ලෙන් සිදුකළ ඉල්ලීමට සහය දැක්වීම සඳහාය. කෙසේ වෙතත්, එය සිදු නොවූ අතර එය 2023 මාර්තු මස 7 වන දිනට කල් තබන ලදී2023 මාර්තු මස 14 වන දින ගරු අභියාචනාධිකරණ විනිසුරුවරුන් විසින් මෙම නඩුව ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ල හමුවේ කැඳවීම පිළිබඳ අදාළ නියෝගය ලබා දුන්නේ පෙර දින ඉදිරිපත් කළ කරුණු සලකා බැලීමෙන් අනතුරුවය. ඒ අනුව මෙම නඩුව අභියාචනාධිකරණයේ පංච පුද්ගල විනිසුරු මඩුල්ලක් ඉදිරියේ කැඳවීමට නියෝග කෙරිණි. කොටුව මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ පවරා ඇති නඩුවට අදාළ චෝදනා පත්‍රය මෙම නඩුවේ තීන්දුව ලබාදෙන තුරු පෙත්සම්කරුට ලබා නොදෙන ලෙසද මෙහිදී නියෝග කෙරිණි.[125]

මාර්තු මස 17 වන දින, අභියාචනාධිකරණයේ පංච පුද්ගල විනිසුරු මඩුල්ලක් ඉදිරියේ කරුණු දැක්වීම සඳහා නඩුව **2023 ජූලි මස 31 වන දින සහ අගෝස්තු මස 9 වන දින ප.ව. 1.30** ට දින නියම කරන ලදී.[126]

## 9 වන කොටස: මාවනැල්ල බුදු පිළිමවලට හානි කිරීමේ සිද්ධියට අදළ නඩුව - HC 4485/21

2022 ජුනි මස 17 වන දින මෙම නඩුව කැඳවන ලදී.[127] මෙම නඩුවේ විත්තිකරුවන් 16 දෙනෙකු සිටින අතර ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අධිචෝදනා ගොනු කරන ලදී. මෙම නඩුවේ විත්තිකරුවන් වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරුන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අධිචෝදනා ගොනු කිරීමේ සිට දණ්ඩ නීති සංග්‍රහය යටතේ අධිචෝදනා ගොනු කිරීමට තෝරා ගැනීම දක්වා තම ස්ථාවරය වෙනස් කිරීමේ අභිප්‍රාය පෙන්නුම් කළහ.[128] 130 8 වන සහ 9 වන විත්තිකරුවන් හැර සෙසු විත්තිකරුවන් තම චෝදනාවලට වරද පිළිගෙන ඇත.[129]

2022 සැප්තැම්බර් මස 13 වන දින අදාළ චෝදනාවලට වරද පිළිනොගත් විත්තිකරුවන් සම්බන්ධයෙන් මෙම නඩුව කැඳවනු ලැබීය.[130] පස්වරු 1.30 ට මෙම නඩුව කැඳවූ අතර විත්තිකරුවන් දෙදෙනාගේ නම් කැඳවනු ලැබුවද, ඔවුන් ඉදිරිපත් කරන ලෙස දැනුම් දී තිබියදීත් බන්ධනාගාර බලධාරීන් විසින් ඔවුන් අධිකරණය වෙත ඉදිරිපත් කළේ නැත.[131] ඉදිරි දින කිහිපය තුළ ඔවුන් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලෙස අධිකරණය විසින් අදාළ බලධාරීන්ට

නියෝග කරන ලදී. අදාළ දිනයේ ත්‍රි පුද්ගල මහාධිකරණයේ කටයුතු සිදු නොවන බව දැනුම් දුන් අතර, මෙම නඩුව වෙනත් දිනයක කැඳවීම සඳහා දින නියම විය.[132]

2022 නොවැම්බර් මස 09 වන දින පෙරවරු 11 ට මෙම නඩුව කැඳවූ අතර 8 වන සහ 9 වන විත්තිකරුවන් බුස්ස බන්ධනාගාරයේ සිට අධිකරණයට ඉදිරිපත් කරන ලදී. එහෙත් නඩු විභාගය පැවැත්වෙන අවස්ථාවේ 8 වන සහ 9 වන විත්තිකරුවන් වෙනුවෙන් කිසිදු නීතිමය නියෝජනයක් නොතිබූ අතර.[133] විත්තිකරුවන් සඳහන් කළේ තම

2023 ජනවාරි මස 18 වන දින පස්වරු 2. 00 ට මෙම නඩුව කැඳවූ අතර අධිචෝදනා සංශෝධනය කිරීමෙන් අනතුරුව 8 වන සහ 9 වන විත්තිකරුවන් වරද පිළිගත්හ. 8 වන සහ 9 වන විත්තිකරුවන්ට වසර 7ක මාස 6ක් අත්හිටවූ සිරදඬුවමකට ද සහ රුපියල් 10,000 බැගින් වූ දඩයක් ද නියම කරන ලදී.

නීතිඥවරුන්ට නිසි උපදෙස් ලබා දී ඇති බවත්, නීතිඥවරුන් අධිකරණයේ පෙනී සිටින බව දැනුම් දුන් බවත්ය.

නඩු භාණ්ඩ සහ ලේඛනවල අඩංගු ලේඛනයක් විවෘත කර අවශ්‍ය පියවර ගැනීමට රජයේ නීතිඥවරයා අධිකරණයෙන් අවසර ඉල්ලා සිටි අතර විනිසුරුවරයා ඒ සඳහා අවසර ලබා දුන්නේ ය අතිරේක සොලිසිටර් ජනරාල්වරයා අධිකරණයට දන්වා සිටියේ තමන්ට අවශ්‍ය උපදෙස් ලබා නොදීම හේතුවෙන් මෙම නඩුව සඳහා සූදානම් වීමට නොහැකි වූ බව යි.[134] අධිකරණයේ කාලය හා සම්පත් අපහසුතාවට පත් කිරීම සම්බන්ධයෙන් අධිකරණය උගත් නීතිඥවරුන්ට දැඩි ලෙස අවවාද කර සිටියේය. මෙය නැවත සිදු නොකළ යුතු බවට අධිකරණය පාර්ශවයන්ට අවවාද කළ අතර විත්තිකරුට ඊළඟ දිනයේ දී නීතිමය නියෝජනයක් සහතික කළ යුතු බවට ද අවධාරණය කරන ලදී. චූදිතයන් ඊළඟ නඩු දිනයේ කටයුතු සඳහා අධිකරණය ඉදිරියේ හෝ ස්කයිප් පහසුකම හරහා පෙනී සිටිය යුතුය බවටත් ප්‍රකාශ කරන ලදී. ඉදිරි දිනයේ නඩු විභාගය සඳහා සූදානම් වන ලෙසත්, එසේ සූදානම් නොවන්නේ නම් ඒ සම්බන්ධයෙන් පූර්ව හෝ නිල වශයෙන් අධිකරණයට දැනුම් දෙන ලෙසත් පාර්ශවයන්ට නියෝග කෙරිණි.[135] විනිසුරුවරයා ජනවාරි මස 10 වැනි දින නිවාඩු ලබා ගොස් තිබූ බැවින් නඩුව කල් දමන ලදී.[136]

මෙම නඩුව එදින අවසන් විය.[137]

## 10 වන කොටස: වනාතවිල්ලුව පුහුණු කඳවුර සහ පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධ නඩුව - පුත්තලම /TAB 107/2021

මෙම නඩුව වනාතවිල්ලුව ප්‍රදේශයෙන් සොයාගත් පාස්කු ප්‍රහාරයට අදාළ පුහුණු කඳවුරක් සහ පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධ නඩුවකි.

2022 නොවැම්බර් මස 15 වන දින පැමිණිල්ල වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරුන් අධිකරණයට දන්වා සිටියේ පැමිණිල්ලේ අංක 12 සහ 13 දරන සාක්ෂිකරුවන් කැඳවා ඇති බවත් සාක්ෂි ලබා ගැනීම සඳහා පැමිණිල්ලේ අංක

13 සාක්ෂිකරු අවසන් වරට කැඳවා නොතිබුණද ඔහු අධිකරණය ඉදිරියේ පෙනී සිටින බවත්ය. [138] නඩුව කැඳවූ අවස්ථාවේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විශ්‍රාමික පොලිස් නිලධාරියෙකු වන අංක 12 දරන සාක්ෂිකරු ඩයස් පද්මසිරි මහතා ප්‍රශ්න කිරීම, හරස් ප්‍රශ්න කිරීම සහ නැවත ප්‍රශ්න කිරීම සඳහා කැඳවනු ලැබීය. [139] විත්තියේ නීතිඥවරුන් විසින් පෙර දිනයක ඉල්ලා සිටි ලේඛනවල පරිවර්තන රජයේ නීතිඥවරයා විසින් භාර දෙන ලදී. පැමිණිල්ලේ සාක්ෂිකරු අංක 01 ට පෙර දින සිතාසියක් නිකුත් කරන ලෙස ඉල්ලා සිටියද සාක්ෂිකරුට එරෙහිව නුවරඑළිය මහාධිකරණයේ අධිචෝදනා ගොනු කර ඇති බැවින් සාක්ෂි ඉදිරිපත් කිරීම සඳහා කැඳවීමට නීතිමය බාධා ඇති බැවින් තාවකාලිකව නිදහස් කරන ලෙස පැමිණිල්ල වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරු අධිකරණයට දැනුම් දුන්හ.[140]

2022 නොවැම්බර් මස 16 වන දින පැමිණිල්ල වෙනුවෙන් පෙනී සිටි රජයේ නීතිඥවරයා අධිකරණයෙන් ඉල්ලා සිටියේ 2023 ජනවාරි මස 24 වන දින නඩුව කැඳවනු ලබන්නේ කවදාද යන්න සඳහා පැමිණිල්ලේ අංක 23, 16, 63 දරන සාක්ෂිකරුවන්ට සහ 2023 ජනවාරි මස 25 වන දින නඩුව කැඳවනු ලබන වේලාව සඳහා පැමිණිල්ලේ අංක 40 සහ 43 සාක්ෂිකරුවන්ට සිතාසි නිකුත් කරන ලෙසයි. 3 වන සහ 4 වන විත්තිකරුවන් සම්බන්ධයෙන් අධිකරණය විසින් එදින ඇප ලබා දීම ප්‍රතික්ෂේප කරන ලදී. [141]

සංශෝධිත 2022 අංක 12 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ මෙය ගොනු කර ඇති බැවින් ඇප ලබා දෙන්නේ පවතින විශේෂ තත්වයන් යටතේ පමණි. මෙම කරුණට අමතරව විත්තිකරුට එරෙහිව වෙනත් නඩු සම්බන්ධයෙන් චෝදනා ගොනු කර ඇති බවත්, පොලිස් නිලධාරීන් ඝාතනය කිරීම සම්බන්ධයෙන් විත්තිකරුට එරෙහිව අධිචෝදනා ගොනු කර ඇති බවත්, යොමු කරන ලද වෛද්‍ය වාර්තාව ට අනුව විත්තිකරු දැනට කිසිදු රෝගී තත්වයකින් පෙළෙන බවක් පෙනෙන්නට නොමැති බවත්, සහ විශේෂ තත්වයන් නොමැති බවත්ය. [142] 4 වන විත්තිකරු කෑගල්ල මහාධිකරණයේ අංක HC 44/21 නඩුවේදී වරද පිළිගෙන ඇති බැවින්, පාස්කු ප්‍රහාරයේදී බෝම්බ 8ක් තැබීමට කුමන්ත්‍රණය කිරීම සම්බන්ධයෙන් මහාධිකරණ නඩුවේ අංක HC TAB 2972/21 යටතේ අධිචෝදනා ගොනු කර ඇති අතර, සහ ඔහුගේ බිරිඳ රිමාන්ඩ් බන්ධනාගාරගත කිරීම ඇප ලබා දීමට තරම් ප්‍රමාණවත් පදනමක් නොමැති බැවින් සහ ඇප ලබා දීම සඳහා විශේෂ තත්වයක් නොමැති බැවින් 4 වන විත්තිකරු සම්බන්ධයෙන් ඇප ප්‍රතික්ෂේප කරමින් මෙම නියෝගය නිකුත් කරන ලදී.

පැමිණිල්ලේ අංක 14-38 දරන සාක්ෂිකරුවන් 2023 ජනවාරි මස 26 වැනි දින කැඳවා තිබුණද සාක්ෂිකරුවන්ගේ අංක 14, 17, 19, 20, 21, 24, 25, 26, 27, 29, 30, 31, 33, 34, 37 පමණක් පෙනී සිටි.[143] අතර නීතිඥවරුන් යෝජනා කළ පරිදි නඩු කටයුතු සංශෝධනය කරන ලදී. ඇතැම් පිළිගැනීම් සටහන් කරගත් අතර පැමිණිල්ලේ අංක 14 සාක්ෂිකරුගේ සාක්ෂි අවසන් වූ අතර සාක්ෂිකරු විසින් 1 වන සහ 2 වන විත්තිකරු හඳුනා ගන්නා ලදී. පසුව සාක්ෂි අංක. 9, 41, 52, 55 සහ 61 ට සිතාසි නිකුත් කළ අතර අනෙක් අය නිදහස් කරන ලදී. [144]

2023 ජුනි මස 7 වන දින මොහොමඩ් සරේජු ආතම් ලෙබ්බේගේ පාපොච්චාරණය සම්බන්ධයෙන් Voir Dire පරීක්ෂණයක් පැවැත්වූ අතර ඔහු පළමු සාක්ෂිකරු ලෙස සාක්ෂි ලබා දුන් අතර එයින් ඇඟවෙන්නේ පාපොච්චාරණය බලහත්කාරයෙන් ලබා දී ඇති බවත් ඔහුට වධ හිංසා පැමිණවූ බවත්ය. Voir Dire පරීක්ෂණය **2023 සැප්තැම්බර් මස 4, 5, 18 සහ 19** යන දිනයන්හි දී පැවැත්වේ. [145]

## 11 වන කොටස: අහ්නාෆ් ජෙසීම්ට එරෙහි නඩුව - HC 148/2021

අහ්නාෆ් ජෙසීම් නම් කවියාට එරෙහිව ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ මෙම නඩුව පවරා ඇත.[146] 2022 නොවැම්බර් මස 16 වන දින 2022 අංක 2 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ (සංශෝධන) පනතේ 195 A (2) වගන්තිය ප්‍රකාරව පූර්ව නඩු විභාගය ආරම්භ කර අවසන් කරන ලදී. විනිසුරුවරයා විසින් කරන ලද විමර්ශනයට ප්‍රතිචාර දක්වමින් විත්තිකරු වෙනුවෙන් දන්වා සිටියේ සාක්ෂිකරුවන් සියලු දෙනාගෙන්ම ප්‍රකාශ ලබාගෙන ඇති බවයි. [147] අධිචෝදනා පත්‍රයේ සඳහන් චෝදනාවලට ඔහු වැරදිකරුදැයි විමසූ විට විත්තිකරු වෙනුවෙන් දන්වා සිටියේ ඔහු වරදකරුවකු නොවන බවයි. [148] එහිදී විනිසුරුවරයා විශේෂඥ සාක්ෂිකරුවන්ගේ සාක්ෂි විමසීමේදී පැමිණිල්ල දන්වා සිටියේ කිසිදු විශේෂඥ සාක්ෂිකරුවකුගේ සාක්ෂි ඉදිරිපත් කිරීමට අදහස් නොකරන බවයි. එහිදී නඩුව තහවුරු කර ඔප්පු කිරීමට අදහස් කරන්නේ කෙසේදැයි විනිසුරුවරයා පැමිණිල්ලෙන් විමසා සිටියේය. පැමිණිල්ලේ මූලිකත්වයෙන් වාචික සාක්ෂි සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරන ලදී. [149] එහිදී රජයේ නීතිඥවරිය අධිකරණයට දන්වා සිටියේ කිසිදු නඩු භාණ්ඩයක් හෝ කිසිදු ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස ඇයට උපදෙස් ලබා දී නොමැති බවයි. ළමා මනෝ චිකිත්සාව පිළිබඳ විශේෂඥ වාර්තා කිහිපයක් නඩු වාර්තාවේ ගොනු කර ඇති බව විනිසුරුවරයාට එහිදී දැනුම් දෙන ලදී එහෙත් විශේෂඥ වාර්තා ඉදිරිපත් කරන බව රජයේ නීතිඥවරයා අධිකරණයට දැනුම් දුන්නේ නැත. [150] පිළිගැනීම් තිබේදැයි විනිසුරුවරයා විමසූ විට විත්තිකරුවන් වෙනුවෙන් දන්වා සිටියේ පිළිගැනීම් කිසිවක් නොමැති බවයි. නඩු විභාගයක් පැවැත්වීම සඳහා සාක්ෂිකරුවන් පරීක්ෂා කිරීම ඇතුළු ව අදාළ පාර්ශවයන්ට ඔවුන්ගේ නඩුවලට අදාළ කරුණු ඉදිරිපත් කිරීමට අවශය විය හැකි ආසන්න කාල සීමාව පිළිබඳව විනිසුරුවරයා විමසූ විට පැමිණිල්ල අධිකරණයට දන්වා සිටියේ සාක්ෂිකරුවන් 14 දෙනෙකු කැඳවීමට අපේක්ෂා කරන බවයි. [151] තවද විත්තිකරුවන් වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා අධිකරණයට දන්වා සිටියේ විත්තිකරු විසින් ගොනු කර ඇති මූලික අයිතිවාසිකම් නඩුව අවශ්‍ය නම් ඉදිරිපත් කිරීමේ අයිතිය තමන් සතු බවයි. ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ පවරා ඇති නඩු කඩිනමින් විභාග කර අවසන් කරන ලෙස ගරු අගවිනිසුරුවරයා මහාධිකරණ නිලධාරීන්ට දැනුම් දුන් බව විනිසුරුවරයා සඳහන් කළේය. එබැවින් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 263 වන වගන්තිය ප්‍රකාරව නඩු විභාගය ආරම්භ කිරීම හැකි ඉක්මනින් සිදු කිරීමට නියමිතය. එපමණක් නොව අධිකරණ කටයුතු දෙමළ භාෂාවට පරිවර්තනය කර විත්තිකරුවන්ට භාර දෙන ලෙසද විනිසුරුවරයා නියෝග කළේය.[152]

2023 පෙබරවාරි 17 වැනි දින, අධිචෝදනා පත්‍රයේ දෙමළ පරිවර්තනය විත්තිකරුට කියවා දෙන ලද අතර විත්තිකරු තමා නිවැරදි බව ප්‍රකාශ කර සිටියේය.[153] පැමිණිල්ලේ සාක්ෂිකරු අංක 2, ස්කූල් ඔෆ් එක්සලන්ස් හි විදුහල්පති සහ පැමිණිල්ලේ සාක්ෂිකරු අංක 6, විත්තිකරුගේ ශිෂ්‍යයෙක් යන දෙදෙනාම ඔවුන්ගේ සාක්ෂි අවසන් කළේය. පැමිණිල්ලේ අංක 8 සාක්ෂිකරුට ඉදිරි දිනට පෙනී සිටින ලෙස අධිකරණය අවවාද කළ අතර පැමිණිල්ලේ සාක්ෂිකරු අංක 9 සහ අංක 10.[154] සඳහා සිතාසි නිකුත් කරන ලදී 2023 මාර්තු මස 23 වන දින රජයේ නීතිඥවරයා පෙනී සිටියේ නැත.[155] වැඩිදුර නඩු විභාගය සඳහා නඩුව 2023 ජුනි මස 28 වන දිනට කල් තබන ලදී. [156]

[1] 'Trial of 25 men accused of Easter Sunday attacks postponed to March 3' (*ColomboPage*, 12 January 2022) <http://www.colombopage.com/archive_22A/Jan12_1641972868CH.php > accessed on 29th of January 2022

**'පාස්කු නඩුව මාර්තු 3 වනදා ට කල්යයි' (*Runews*,**12 January 2022) < https://runews.lk/news/item/27169-the-easter-trial-is-set-for-march-3 > accessed on 30th of January 2022

[2] Sirasa, 'News 1st Prime Time Sinhala News – 7 PM' (23 November 2021) <https://youtu.be/ruDYyKlETCQ?t=1393> (Time duration: 24:50 - 25:45) accessed on 30th November 2021

Ada Derana, 'Ada Derana Prime Time News Bulletin' (23 November 2021) <https://youtu.be/krMXahiVbvg?t=1877 > )Time duration: 31:43 - 31:56) accessed on 1 December 2021

[3] Trial monitoring report on 12th of January, 2022 – Case No: HC (TAB) 2972/21

[4] Trial monitoring report on 12th of January, 2022 – Case No: HC (TAB) 2972/21

'Trial of 25 men accused of Easter Sunday attacks postponed to March 3' (*ColomboPage*, 12 January 2022) <http://www.colombopage.com/archive_22A/Jan12_1641972868CH.php > accessed on 29th of January 2022

**'පාස්කු නඩුව මාර්තු 3 වනදා ට කල්යයි' (*Runews*,** 12 January 2022) < https://runews.lk/news/item/27169-the-easter-trial-is-set-for-march-3 > accessed on 30th of January 2022

[5] Trial monitoring report on 12th of January, 2022 – Case No: HC (TAB) 2972/21

[6] Trial monitoring report on 24th of November 2022– Case No: HC (TAB) 2972/21

[7] Trial monitoring report on 12th of January, 2022 – Case No: HC (TAB) 2972/21

[8] Trial monitoring report on 12th of January, 2022 – Case No: HC (TAB) 2972/21

[9] Daily FT, 'Full trial of Easter Sunday terror attack suspects from 12 May' <https://www.ft.lk/news/Full-trial-of-Easter-Sunday-terror-attack-suspects-from-12-May/56-731521> accessed on 12th of December 2022

[10] Daily FT, 'Full trial of Easter Sunday terror attack suspects from 12 May' <https://www.ft.lk/news/Full-trial-of-Easter-Sunday-terror-attack-suspects-from-12-May/56-731521> accessed on 12th of December 2022

[11] Trial monitoring report on 03rd of March 2022 – Case No: HC (TAB) 2972/21

[12] Trial monitoring report on 03rd of March 2022 – Case No: HC (TAB) 2972/21

[13] Daily FT, 'Full trial of Easter Sunday terror attack suspects from 12 May' <https://www.ft.lk/news/Full-trial-of-Easter-Sunday-terror-attack-suspects-from-12-May/56-731521> accessed on 12th of December 2022

[14] Trial monitoring report on 03rd of October 2022 – Case No: HC (TAB) 2972/21

[15] Trial monitoring report on 03rd of October 2022 – Case No: HC (TAB) 2972/21

[16] Trial monitoring report on 03rd of October 2022 – Case No: HC (TAB) 2972/21

[17] Trial monitoring report on 24th of November 2022– Case No: HC (TAB) 2972/21

[18] Trial monitoring report on 24th of November 2022– Case No: HC (TAB) 2972/21

[19] Trial monitoring report on 24th of November 2022– Case No: HC (TAB) 2972/21

[20] Trial monitoring report on 24th of November 2022– Case No: HC (TAB) 2972/21

[21] Trial monitoring report on 04th January 2023– Case No: HC (TAB) 2972/21

[22] Trial monitoring report on 04th January 2023– Case No: HC (TAB) 2972/21

[23] Trial monitoring report on 05th January 2023– Case No: HC (TAB) 2972/21

[24] Trial monitoring report on 01st February 2023– Case No: HC (TAB) 2972/21

[25] Trial monitoring report on 28th February 2023– Case No: HC (TAB) 2972/21

[26] Trial monitoring report on 31st March 2023– Case No: HC (TAB) 2972/21

[27] Trial monitoring report on 24th May and 02nd June 2023– Case No: HC (TAB) 2972/21

[28] Trial monitoring report on 02nd June 2023– Case No: HC (TAB) 2972/21

[29] Sirasa, 'News 1st Prime Time Sinhala News – 10PM (18/01/2022) රාත්‍රී 10.00 ප්‍රධාන ප්‍රවෘත්ති' (18 January 2022) < https://www.youtube.com/watch?v=GOAEcru6gI0&t=1164s > accessed on 25th of January 2022 (Time duration 18:57 - 20:56)

[30] Hiru, 'හිරු රාත්‍රී 6.55 ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශය - Hiru TV NEWS 6.55 PM Live 2022-01-18' (18 January 2022) <**https://youtu.be/xM5frwcgK9E?t=2329**> accessed on 25th of January 2022 (Time duration 34:09 - 34:54)

[31] Sirasa, 'News 1st Prime Time Sinhala News – 10PM (18/01/2022) රාත්‍රී 10.00 ප්‍රධාන ප්‍රවෘත්ති' (18 January 2022) < https://www.youtube.com/watch?v=GOAEcru6gI0&t=1164s > accessed on 25th of January 2022 (Time duration 18:57 - 20:56)

Hiru, 'හිරු රාත්‍රී 6.55 ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශය - Hiru TV NEWS 6.55 PM Live 2022-01-18' (18 January 2022) <**https://youtu.be/xM5frwcgK9E?t=2329**> accessed on 25th of January 2022 (Time duration 34:09 - 34:54)

[32] Sirasa, 'News 1st Prime Time Sinhala News – 10PM (18/01/2022) රාත්‍රී 10.00 ප්‍රධාන ප්‍රවෘත්ති' (18 January 2022) < https://www.youtube.com/watch?v=GOAEcru6gI0&t=1164s > accessed on 25th of January 2022 (Time duration 18:57 - 20:56)

[33] Sirasa, 'News 1st Prime Time Sinhala News – 10PM (18/01/2022) රාත්‍රී 10.00 ප්‍රධාන ප්‍රවෘත්ති' (18 January 2022) < https://www.youtube.com/watch?v=GOAEcru6gI0&t=1164s > accessed on 25th of January 2022 (Time duration 18:57 - 20:56)

[34] Sirasa, 'News 1st Prime Time Sinhala News – 10PM (18/01/2022) රාත්‍රී 10.00 ප්‍රධාන ප්‍රවෘත්ති' (18 January 2022) < https://www.youtube.com/watch?v=GOAEcru6gI0&t=1164s > accessed on 25th of January 2022 (Time duration 18:57 - 20:56)

Zulfick Farzan, 'Joint effort could have prevented Easter Attacks – Deshabandu' (*News 1st*, 18 January 2022) <https://www.newsfirst.lk/2022/01/18/joint-effort-could-have-prevented-easter-attacks-deshabandu/ > accessed on 31st of January 2022

[35] Chamath, 'Ex IGP made prior warning to four top Police officers.-Senior DIG | Sri Lanka News' (,18 January 2022) < https://thesinhalanews.lk/2022/01/18/ex-igp-made-prior-warning-to-four-top-police-officers-senior-dig-sri-lanka-news/ > accessed on 31st of January 2022

Trial monitoring report on 18th of January, 2022 – Case No: HC (TAB) 2900/21

[36] Trial monitoring report on 18th of January, 2022 – Case No: HC (TAB) 2900/21

[37] Trial monitoring report on 18th of January, 2022 – Case No: HC (TAB) 2900/21

[38] Trial monitoring report on 18th of January, 2022 – Case No: HC (TAB) 2900/21

[39] Trial monitoring report on 18th of January, 2022 – Case No: HC (TAB) 2900/21

[40] Chamath, 'Ex IGP made prior warning to four top Police officers.-Senior DIG | Sri Lanka News' (,18 January 2022) < https://thesinhalanews.lk/2022/01/18/ex-igp-made-prior-warning-to-four-top-police-officers-senior-dig-sri-lanka-news/ > accessed on 31st of January 2022

Trial monitoring report on 18th of January, 2022 – Case No: HC (TAB) 2900/21

[41] Trial monitoring report on 18th of January, 2022 – Case No: HC (TAB) 2900/21

[42] Derana 'අද දෙරණ රාත්‍රී 10.00 පුවත් විකාශය - 2022.01.19 | Ada Derana Late Night News Bulletin' (19 January 2022) < https://youtu.be/o0n6qqC3Juk?t=667 > accessed on 26th of January 2022 (Time duration 11.06 – 15:24)

'පාස්කු ප්‍රහාරය නඩුවේ ලේඛන 6ක් ගැන ප්‍රකාශයක්' (*Runews*,19 January 2022) < https://www.runews.lk/news/item/27319-statement-on-6-documents-in-the-easter-attack-case > accessed on 30th of January 2022

'පූජිත්ට එරෙහිව ගෙනා ලේඛන පූජිත්ගේ පිහිටට' (*අයිතිය*, 20 January 2022) <https://www.aithiya.lk/12852/pujith-jayasundara-presidential-commission-of-inquiry-pasku-attack/ > accessed on 30th of January 2022

[43] Derana ' අද දෙරණ රාත්‍රී 10.00 පුවත් විකාශය - 2022.01.19 | Ada Derana Late Night News Bulletin' (19 January 2022) < https://youtu.be/o0n6qqC3Juk?t=667 > accessed on 26th of January 2022 (Time duration 11.06 – 15:24)

Hiru, 'හිරු රාත්‍රී 6.55 ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශය - Hiru TV NEWS 6:55 PM Live | 2022-01-19' < https://youtu.be/PW2YBQP2fFc?t=1470 > accessed on 26th of January 2022 (Time duration: 24:31 – 27:32)

[44] Derana ' අද දෙරණ රාත්‍රී 10.00 පුවත් විකාශය - 2022.01.19 | Ada Derana Late Night News Bulletin' (19 January 2022) < https://youtu.be/o0n6qqC3Juk?t=667 > accessed on 26th of January 2022 (Time duration 11.06 – 15:24)

Hiru, 'හිරු රාත්‍රී 6.55 ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශය - Hiru TV NEWS 6:55 PM Live | 2022-01-19' < https://youtu.be/PW2YBQP2fFc?t=1470 > accessed on 26th of January 2022 (Time duration: 24:31 – 27:32)

[45] Derana ' අද දෙරණ රාත්‍රී 10.00 පුවත් විකාශය - 2022.01.19 | Ada Derana Late Night News Bulletin' (19 January 2022) < https://youtu.be/o0n6qqC3Juk?t=667 > accessed on 26th of January 2022 (Time duration 11.06 – 15:24)

Hiru, 'හිරු රාත්‍රී 6.55 ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශය - Hiru TV NEWS 6:55 PM Live | 2022-01-19' < https://youtu.be/PW2YBQP2fFc?t=1470 > accessed on 26th of January 2022 (Time duration: 24:31 – 27:32)

[46] Derana ' අද දෙරණ රාත්‍රී 10.00 පුවත් විකාශය - 2022.01.19 | Ada Derana Late Night News Bulletin' (19 January 2022) < https://youtu.be/o0n6qqC3Juk?t=667 > accessed on 26th of January 2022 (Time duration 11.06 – 15:24)

Hiru, 'හිරු රාත්‍රී 6.55 ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශය - Hiru TV NEWS 6:55 PM Live | 2022-01-19' < https://youtu.be/PW2YBQP2fFc?t=1470 > accessed on 26th of January 2022 (Time duration: 24:31 – 27:32)

[47] Trial monitoring report on 20th of January, 2022 – Case No: HC (TAB) 2900/21

Derana 'අද දෙරණ 6.55 ප්‍රධාන පුවත් විකාශය - 2022.01.20 | Ada Derana Prime Time News Bulletin' (20 January 2022)< https://youtu.be/1J4pC00mvbI?t=1794 > accessed on 27th of January 2022 (Time duration 29:56 – 30:34)

Hiru, 'හිරු රාත්‍රී 6.55 ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශය - Hiru TV NEWS 6:55 PM Live | 2022-01-20' (20 January 2022) <https://youtu.be/FIU9SDbsc78?t=1871> accessed on 27th of January 2022 (Time duration 31:11 – 31:38)

[48] Trial monitoring report on 20th of January, 2022 – Case No: HC (TAB) 2900/21

[49] Trial monitoring report on 20th of January, 2022 – Case No: HC (TAB) 2900/21

[50] Trial monitoring report on 18th of February, 2022 – Case No: HC (TAB) 2900/21

Sirasa, ‘News 1st Prime Time Sinhala News – 7PM (18/02/2022) රාත්‍රී 7.00 ප්‍රධාන ප්‍රවෘත්ති’ <https://youtu.be/jvS2yeAKvxs?t=95 > accessed on 25th Of February 2022 (Time Duration: 1:34 – 4:34)

හිරු රාත්‍රී 6.55 ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශය - Hiru TV NEWS 6:55 PM Live | 2022-02-18 < https://youtu.be/-sgw_Z_ergA?t=130 > accessed on 25th Of February 2022 (Time Duration 2:08 – 14:16)

[51] Sirasa, ‘News 1st Prime Time Sinhala News – 7PM (18/02/2022) රාත්‍රී 7.00 ප්‍රධාන ප්‍රවෘත්ති’ <https://youtu.be/jvS2yeAKvxs?t=95 > accessed on 25th Of February 2022 (Time Duration: 1:34 – 4:34)

[52] *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව පූජිත් සේනාධි බණ්ඩාර ජයසුන්දර* HC (TAB) 2900/2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 4 වන ඡේදය

[53] දණ්ඩ නීති සංග්‍රහය, 100 වගන්තියේ 3 වන කොටස

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව පූජිත් සේනාධි බණ්ඩාර ජයසුන්දර* HC (TAB) 2900/2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 30 ඡේදය, 34 ඡේදය, 38 ඡේදය

[54] *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව පූජිත් සේනාධි බණ්ඩාර ජයසුන්දර* HC (TAB) 2900/ 2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 182 ඡේදය

[55] *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව පූජිත් සේනාධි බණ්ඩාර ජයසුන්දර* HC (TAB) 2900/ 2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 183 ඡේදය

[56] *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව පූජිත් සේනාධි බණ්ඩාර ජයසුන්දර* HC (TAB) 2900/ 2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 183 ඡේදය

[57] *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව පූජිත් සේනාධි බණ්ඩාර ජයසුන්දර* HC (TAB) 2900/ 2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 18 ඡේදය

[58] *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව පූජිත් සේනාධි බණ්ඩාර ජයසුන්දර* HC (TAB) 2900/ 2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 190 ඡේදය

[59] *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව පූජිත් සේනාධි බණ්ඩාර ජයසුන්දර* HC (TAB) 2900/ 2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 191 ඡේදය

[60] *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව පූජිත් සේනාධි බණ්ඩාර ජයසුන්දර* HC (TAB) 2900/ 2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 257 ඡේදය

[61] *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව පූජිත් සේනාධි බණ්ඩාර ජයසුන්දර* HC (TAB) 2900/ 2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 192, 193, 259 ඡේදය

[62] BBC. “පාස්කු ප්‍රහාර නඩුව:හේමසිරි සහ පූජිත් නිදහස් කිරීමට එරෙහි පෙත්සම් විභාගයට දින නියම වෙයි.” BBC News Sinhala, 13 Mar. 2023, www.bbc.com/sinhala/articles/c7215gnn5n9o.

[63] Trial monitoring report on 18th of January, 2022 – Case No: HC (TAB) 2899/21

[64] Trial monitoring report on 18th of January, 2022 – Case No: HC (TAB) 2899/21

[65] Derana ‘ අද දෙරණ රාත්‍රී 10.00 පුවත් විකාශය - 2022.01.19 | Ada Derana Late Night News Bulletin’ (19 January 2022) < https://youtu.be/o0n6qqC3Juk?t=667 > accessed on 26th of January 2022 (Time duration 11.06 – 15:24)

[66] Trial monitoring report on 19th of January, 2022 – Case No: HC (TAB) 2899/21

[67] Derana ‘අද දෙරණ රාත්‍රී 10.00 පුවත් විකාශය - 2022.01.19 | Ada Derana Late Night News Bulletin’ (19 January 2022) < https://youtu.be/o0n6qqC3Juk?t=667 > accessed on 26th of January 2022 (Time duration 11.06 – 15:24)

Hiru, ‘හිරු රාත්‍රී 6.55 ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශය - Hiru TV NEWS 6:55 PM Live | 2022-01-19’ < https://youtu.be/PW2YBQP2fFc?t=1470 > accessed on 26th of January 2022 (Time duration: 24:31 – 27:32)

[68] Hiru, ‘හිරු රාත්‍රී 6.55 ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශය - Hiru TV NEWS 6:55 PM Live | 2022-01-19’ < https://youtu.be/PW2YBQP2fFc?t=1470 > accessed on 26th of January 2022 (Time duration: 24:31 – 27:32)

[69] Trial monitoring report on 18th of February, 2022 – Case No: HC (TAB) 2899/21

